**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ("මණ්ඩලය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව මණ්ඩලය කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | තොග පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 02) 9 වැනි ඡේදයට සහ මණ්ඩලයේ ගිණුම් ප්‍රතිපත්ති සටහන් අංක 3.2.1 පටහැනිව, වසර තුනක කාලයක් තිස්සේ චලනය නොවූ එකතුව රු. 647,357,338 ක් වූ තොග ඒවායේ ශුද්ධ උපලබ්ධි කරගත හැකි අගයන් තක්සේරු කිරීමකින් තොරව එහි පිරිවැයට වාර්තා කර තබුණි. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2 හි 6 වන වගන්තියට අනුකූලව, එකී ප්‍රමිතියේ 9 වන වගන්තියට අනුව සැලකිය යුතු තොගවල ශුද්ධ උපලබ්ධි කරගත හැකි අගය ගණනය කිරීම ප්‍රායෝගික නොවේ. තවද, එම ප්‍රමිතියේ 32 වැනි වගන්තියට අනුව, තොග නිෂ්පාදනය සඳහා භාවිත කිරීමට තබා ඇති ද්‍රව්‍ය සහ අනෙකුත් සැපයුම්, ඒවා ඇතුළත් කරනු ලබන නිමි භාණ්ඩ පිරිවැයට හෝ ඊට වැඩි මිලකට විකිණීමට අපේක්ෂා කරන්නේ නම්, ඒවා පිරිවැයට වඩා අඩුවෙන් ලියා හැරිය නොහැක. තවද, ව්‍යාපාරයේ ස්වභාවය අනුව, නල පිපිරීම් ඇතුළු අනපේක්ෂිත අවස්ථාවන්හිදී පැන නගින හදිසි ඉල්ලුම සපුරාලීම සඳහා සැලකිය යුතු තොග ප්‍රමාණයක් රඳවා තබා ගනී. අයිතම චලනය නොවනවාද නැද්ද යන්න තීරණය කිරීම සඳහා සලකා බලනු ලබන නිර්ණායක මත පදනම්ව, මෙම සියලු අයිතම අඛණ්ඩව වසර තුනක කාලයක් තිස්සේ චලනය නොවන තොග ලෙස වාර්තා කර ඇති බව පැවසිය නොහැක. එබැවින්, මෙම චලනය නොවන තොග සඳහා ශුද්ධ උපලබ්ධි කරගත හැකි අගය තක්සේරු කිරීම අවශ්‍ය නොවේ. එබැවින්, මෙම විමසුම ඉවත් කරන ලෙස ඉල්ලා සිටිමි. | තොගවල වටිනාකම හඳුනා ගැනීම ශ්‍රී.ලං.ගි.ප්‍ර 02 සහ මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූල වන බවට සහතික වීම සහ ඔබගේ අදහස් දැක්වීම්වලට අනුව අනුකූල වීම ප්‍රායෝගික නොවේ නම්, නිසි අනුමැතියකින් ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කළ හැක. |
| ii. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 07) 07 වැනි වගන්තියට පටහැනිව මුදල් හා | එස්ක්‍රෝ ඉතිරිකිරීමේ ගිණුම මුදල් ලබා ගැනීම සඳහා සහ එම මුදල් ඩොලර්වලින් ගෙවීම් කිරීම සඳහා නිර්මාණය කර ඇත. | අවශ්‍ය ගනුදෙනු සඳහා එම ගිණුම් දෙක පහසුවෙන් භාවිතා කල |

| | | | |
|---|---|---|---|
| | මුදල්වලට සමාන දෑ ලෙස හඳුනා ගැනීම වෙනුවට රු. 1,500,083 ක් වූ ඉතිරිකිරීමේ ගිණුම් ශේෂය සහ රු. මිලියන 18,887.57 ක් වූ එස්ක්‍රෝ ඉතිරිකිරීමේ ගිණුම් ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිළිවෙලින් මූල්‍ය වත්කම් සහ ආයෝජන යටතේ වර්ගීකරණය කර තිබුණි. | එබැවින්, එස්ක්‍රෝ ඉතිරිකිරීමේ ගිණුමේ ඇති මුදල් ණය ගැණුම්කරුට (මණ්ඩලය) මුදල් හා මුදල්වලට සමාන දෑ ලෙස නිදහසේ භාවිතා කල නොහැක.<br>කෙටි කාලීනව භාවිතා කිරීමේ අරමුණින් තොරව ලංකා බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමේ මුදල් තැන්පත් කර ඇත. | හැකිය. එබැවින්, වත්කම් ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 07 සමඟ අනුකූල වන බවට සහතික වීම. |
| iii. | ආරම්භක ශේෂයන් වර්ගීකරණය වෙනස් කිරීම හේතුවෙන් වත්කම් සහ ක්ෂයවීම් සඳහා එකතුව රු. 519,671,859 ක් වූ පූර්ව වර්ෂ ගැලපීම් සමාලෝචිත වර්ෂය තුළදී සිදු කර තිබුණි. තවද, වත්කම් සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක නොකර මණ්ඩලය විසින් 2012 වසරේ සිට මෙම ක්‍රමය අනුගමනය කරන බව නිරීක්ෂණය විය. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 8 අනුව, පූර්ව කාල පරිච්ඡේද වැරදි නිවැරදි කිරීම නියාමන අවශ්‍යතාවයකි.<br>ගණුදෙනුවල ඇති සංකීර්ණතාවය නිසා අදාළ වර්ෂයෙන් පසු ගැලපීම් සිදු කිරීමට සිදුවේ. එබැවින්, මණ්ඩලය එකී අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇත. | එම ගැලපීම් සෑම වසරකම මූල්‍ය ප්‍රකාශනවලට සැලකිය යුතු වෙනස්කම් සිදු කර ඇති බැවින් පූර්ව වර්ෂ ගැලපීම් අවම කිරීම සඳහා අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දීම. |
| iv. | රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සහ රජයේ ආධාර හෙළිදරව් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) විධිවිධානවලට පටහැනිව, වසර 15 ක කාලයක් තිස්සේ ක්‍රමක්ෂය කිරීමකින් තොරව ව්‍යාපෘති 28 කට අදාළව එකතුව රු. 10,445,367,769 ක විදේශ ප්‍රදාන ශේෂයක් සහ වසර 12 ක කාලයක් තිස්සේ ක්‍රමක්ෂය කිරීමකින් තොරව ව්‍යාපෘති 05 කට අදාළව එකතුව රු. 3,258,974,255 ක විදේශ ප්‍රදාන ශේෂයක් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පැවති බව නියැදි විගණන පරීක්ෂණයේදී අනාවරණය විය. සමාලෝචිත වර්ෂයේදී, එම විදේශ ප්‍රදානවලට අදාළ තොරතුරු නොමැති බැවින් ක්‍රමක්ෂය නොකිරීමෙන් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | ඉඩම් ඇතුළු ක්ෂය නොකළ වත්කම්වලට අදාළ ප්‍රදාන කාල සීමාව තුළ ක්ෂය නොවී පැවතුනි. එසේම, පවතින ගොඩනැගිලිවල ආයු කාලය වසර 50 ඉක්මවයි. එවැනි කාල සීමාවක් දක්වා අදාළ ප්‍රදාන ක්ෂය වේ.<br>ප්‍රදාන සමූහයක් වශයෙන් ලැබෙන නමුත් තනි තනි වත්කම්වලට අදාළව ක්ෂය අනුපාතය අනුව ක්‍රමක්ෂය කරයි. | අදාළ ගිණුම්කරණ ප්‍රමිතිවල විධිවිධානවලට අනුකූලව ලැබෙන විදේශ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමට කටයුතු කළ යුතු අතර එම ප්‍රදානයට අදාළ නිශ්චිත වත්කම් හඳුනාගනිමින් සිදු කරනු ලබන ප්‍රදාන ක්‍රමක්ෂය ඇතුළුව විස්තරාත්මක ලේඛණයක් ක්‍රමක්ෂයවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීම සඳහා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| v. | දේපල, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 16) 51 වන වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන ස්ථාවර වත්කම් කාණ්ඩ 14 කට අයත් වටිනාකම රු.බිලියන 2.93 ක් වන | ශ්‍රී.ලං.ගි.ප්‍ර 16 හි 51 වන වගන්තිය ප්‍රකාරව, රට පුරා විසිරී ඇති අතිවිශාල වත්කම් පදනමක් පැවතීම සහ මණ්ඩලයට සුවශේෂී වන සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් පැවතීම නිසා මණ්ඩලයේ වත්කම් පදනම තක්සේරු කිරීම ප්‍රායෝගික නොවේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 16 හි අවශ්‍යතාවලට අනුකූල වන බවට සහතික වීම. |

| | | | |
|---|---|---|---|
| | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල ඵලදායී ජීවිත කාලය ගැලපීම සඳහා වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. | එබැවින්, වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කිරීමට සුදුසු තක්සේරු නිලධාරියෙකුගේ සේවය ලබා ගැනීම අපහසුය. | |
| vi. | රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සහ රජයේ ආධාර හෙළිදරව් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) අවශ්‍යතාවයට අනුව 2021 වර්ෂය තුළදී ලද ආදායම් ලෙස හඳුනාගැනීම වෙනුවට රුහුණුපුර ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කොන්ත්‍රාත්කරුගෙන් හම්බන්තොට කළමණාකාර කාර්යාලයට ලද රු. 27,669,420 ක් වටිනා තොග අයිතම සහ අක්කරෙයිපත්තු කළමණාකාර කාර්යාලයට ලද රු. 51,615,532 ක් වටිනා තොග අයිතම විදේශ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හඳුනාගෙන තිබුණි. | යෝජනා ක්‍රමය ප්‍රාග්ධනීකරණය කිරීමෙන් පසු කොලොන් ග්ලෝබල් කොන්ත්‍රාත්කරුගෙන් ලද තොග අයිතම්වල වටිනාකම වූ රු.27,669,420 ප්‍රදාන ගිණුමට එරෙහිව ගිණුම්ගත කරන ලද ව්‍යාපෘති විෂය පථයට ඇතුළත් නොවේ. තවද, එවැනි අයිතම නිකුත් කරන විට මෙම ප්‍රදාන පියවනු වනු ඇත. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 01 හි විධිවිධානවලට අනුකූල වන බවට සහතික වීම. |
| vii. | මූල්‍ය ප්‍රකාශන සඳහා වෙනම සටහනක් මඟින් ගොඩනැගිල්ල ආයෝජන දේපලක් ලෙස මණ්ඩලය විසින් හඳුනාගෙන තිබුණද, ශ්‍රී.ලං.ගි.ප්‍ර 01 හි 54 (බී) වගන්තියේ අවශ්‍යතාවයට අනුව එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම අයිතමයක් ලෙස එය ඉදිරිපත් කර නොතිබුණි. තවද, තක්සේරු ආකෘතිය සහ ආයෝජන දේපලවලින් වන ආදායම ශ්‍රී.ලං.ගි.ප්‍ර 40 හි 75 (ඒ) සහ (එෆ්) (i) වගන්තිවල අවශ්‍යතාවයට අනුව, අනාවරණය කර නොතිබුණි. | දැනට ජල සම්පාදන අමාත්‍යාංශය විසින් අත්පත් කරගෙන සිටින මණ්ඩලය විසින් ඉදිකරන ලද ගොඩනැගිල්ල ආයෝජන දේපලක් ලෙස හඳුනාගැනීම, ශ්‍රී.ලං.ගි.ප්‍ර 40 හි 14 වන වගන්තිය අනුව විනිශ්චය කරනු ලැබේ. එබැවින්, ඉහත ප්‍රමිතියේ 75 (සී) වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශනවල එවැනි ගැලපීමක් අවශ්‍ය නොවේ. | ආයෝජන දේපල හඳුනාගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (ශ්‍රී.ලං.ගි.ප්‍ර 40) අනුකූල වන බවට සහතික වීම. |
| viii. | මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 09) 5.5 වගන්තියට පටහැනිව, අපේක්ෂිත ණය පාඩු හඳුනා නොගෙන ස්ථාවර අනුපාතයක් මත 2022 දෙසැම්බර් 31 දිනට මලාපවහන ණය ගැතියන් සහ වෙනත් ණය ගැතියන් සඳහා රු. 42,006,611 ක හානිකරණ ප්‍රතිපාදනයක් සිදු කර තිබුණි. | මෙය වෙළඳ සහ වෙනත් ලැබිය යුතු ශේෂයෙන් සියයට 4.3 ක් නියෝජනය කරන අතර මෙම ශේෂයන් සඳහා මේ දක්වා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත. එබැවින්, ශ්‍රී. ලං.මූ.වා.ප්‍ර 09 හි අපේක්ෂිත ණය පාඩු ක්‍රමය අනුගමනය කිරීමෙන් මෙම ශේෂයට සැලකිය යුතු වෙනසක් සිදු නොකරනු ඇත. | ණය ගැතියන් සඳහා හානිකරණ ප්‍රතිපාදන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 09) අනුකූල වන බවට සහතික වීම. |
| ix. | අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 38) 118 වැනි වගන්තියට අනුව, රු. මිලියන 27.73 | මුළු අස්පෘශ්‍ය වත්කම් මුළු වත්කම්වලින් සියයට 0.0029 ක් නියෝජනය කරයි. එබැවින්, සෑම වසරකම එය සමාලෝචනය | වටිනාකම ප්‍රමාණාත්මක නොවන විටකදී වුවත් හෙළිදරව් කිරීමේ |

| | | | |
|---|---|---|---|
| | ක් වටිනා අස්පෘශ්‍ය වත්කම්වලට අදාළව කාල පරිච්ඡේදය ආරම්භයේ සහ අවසානයේ දළ ධාරණ වටිනාකම සහ සමුච්චිත ක්‍රමක්ෂය වැනි අදාළ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. තවද, අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 38) 104 වැනි ඡේදයේ දක්වා ඇති පරිදි අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකම අස්පෘශ්‍ය වත්කම් සඳහා ක්‍රමක්ෂය කිරීමේ කාල පරිච්ඡේදය සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය සමාලෝචනය කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | කිරීම අවශ්‍ය නොවේ. තවද, ශ්‍රී.ලං.ගි.ප්‍ර 38 හි 74 වන වගන්තියට අනුව, මණ්ඩලය අස්පෘශ්‍ය වත්කම් ගිණුම්ගත කිරීම සඳහා පිරිවැය ආකෘතිය යොදා ගනියි. එබැවින්, ක්‍රමක්ෂය කිරීමේ කාල පරිච්ඡේදය සමාලෝචනය කිරීම අවශ්‍ය නොවේ. | අවශ්‍යතාවය ප්‍රමිතය මඟින් වළක්වා නොමැත. එබැවින්, හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය – 38 ට අනුකූල වන බවට සහතික වීම. |
| x. | කල්බදු පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය (එස්එල්එෆ්ආර්එස් 16) ප්‍රකාරව කල්බදු වත්කම් ලෙස හඳුනා ගැනීම වෙනුවට 2009 දෙසැම්බර් 11 දිනැති අංක 3702 දරන බදු ගිවිසුම යටතේ කොළඹ මහ නගර සභාවෙන් ලබාගත් රු. 151,503,750 ක් වටිනා දකුණු කොළඹ කාර්යාල ගොඩනැගිල්ල මණ්ඩලයේ සින්නක්කර ඉඩමක් ලෙස වර්ග කර තිබුණි. තවද, 2014 දෙසැම්බර් 10 සිට මණ්ඩලය විසින් බදු ගිවිසුමේ සඳහන් මිල සංශෝධනය කර නොතිබූ අතර කුලී ගෙවීමකින් තොරව ඉඩම සහ ගොඩනැගිල්ල අඛණ්ඩව භාවිතා කරයි. | දකුණු කොළඹ කාර්යාලය සහ අනෙකුත් මණ්ඩලයේ කාර්යාල ගොඩනැගිල්ල ස්ථාපිත කරන ලද ඉඩම 2009 දෙසැම්බර් 11 දිනැති අංක 3702 දරන බදු ගිවිසුම යටතේ රු. 151, 503,750.00 කට ලබා ගන්නා ලදී. විමසුමේ දක්වා ඇති පරිදි සින්නක්කර ඉඩමක් ලෙස වර්ගීකරණය කර නොමැති අතර මෙම පරිශ්‍රය කල්බදු වත්කම් යටතේ (ලෙජර් කේතය 102) නිවැරදිව වර්ගීකරණය කර ඇත. | එය ලෙජර් ගිණුමේ නිවැරදිව සටහන් කර ඇතත්, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමේදී එය කල්බදු දේපල ලෙස නිවැරදි කළ යුතු අතර බදු කාල පරිච්ඡේදය තුළ මූලික ගෙවීම ක්‍රමක්ෂය කළ යුතුය. නීතිමය ගැටළු මඟහරවා ගැනීම සඳහා කල්බදු කුලිය සමාලෝචනය කර කල්බදු කුලිය නිසි ලෙස ගෙවිය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල 3.2.1 වගන්තියට අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට තොග ශේෂය භරිත සාමාන්‍ය පිරිවැය (ඩබ්ලිව්ඒසී) ක්‍රමයට තක්සේරු කර තිබූ අතර තොග අගය කිරීමේදී ඩබ්ලිව්ඒසී ක්‍රමය යොදා ගැනීමේදී මිල විචලනයන් සමස්ත ආයතනයක් ලෙස පැවතිය නොහැක. කෙසේ වෙතත්, රු. 249,392,359 ක | තොග කළමනාකරණ පද්ධතිය සම්පූර්ණයෙන් සම්පූර්ණ වන තුරු, පද්ධතිය හරහා පැන නගින ඉහළ මිල විචලනය, තොග ගැලපුම් ගිණුම හරහා නිවැරදි කරනු ඇත.<br>ලෙජරය සහ තොග සත්‍යාපනය අතර දිවයින පුරා මුළු මිල විචලනය, සම්පූර්ණ භෞතිකව සත්‍යාපිත තොග ශේෂයෙන් සියයට 1 ක් පමණ බව නිරීක්ෂණය විය. අයිඑම්එස් හරහා සියලුම ගබඩා ක්‍රියාත්මක | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අසාමාන්‍ය මිල විචලනයන් තොග ගැලපුම් ලෙස තොග වටිනාකමින් අඩු කර තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල තොග වටිනාකමේ නිරවද්‍යතාවය විගණනයේදී සත්‍යාපනය කළ නොහැක. | කිරීම සහ අනෙකුත් පද්ධති වර්ධනයන් සමඟ අනාගතයේදී මිල විචලනය ඉතා අවම වනු ඇතැයි අපේක්ෂා කෙරේ. | |
| ii. | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල 3.2.1 වගන්තියට අනුව, තොග ශේෂයට යල්පැනගිය සහ සෙමින් චලනය වන තොග සඳහා ප්‍රතිපාදන සිදු කළ යුතුය. කෙසේ වෙතත්, ගිණුම් පොත්වලට අනුව, යල්පැනගිය සහ භාවිත කළ නොහැකි තොග සඳහා පමණක් රු. 236,958,510 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර සෙමින් චලනය වන තොග සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි. | තොග ප්‍රතිපාදන සඳහා යල්පැනගිය සහ භාවිත කළ නොහැකි තොග අයිතම පමණක් සලකා බලයි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2022 දෙසැම්බර් 31 දිනට සැමට ජලය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිදහස් නොකළ පයිප්ප සහ සවි කිරීම් සඳහා ගෙවිය යුතු බහාලුම් සහ ලයින් ප්‍රමාද ගාස්තුව වන රු. 1,192,717,747 ක මුදල සඳහා මණ්ඩලය ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. එබැවින්, වසරේ අලාභය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අසම්භාව්‍ය සිදුවීම් පිළිබඳ සියලු තොරතුරු අදාළ පාර්ශවලින් කැඳවා එම තොරතුරු වාර්තා කරන ලදී.<br>බහාලුම් 734 න් බොහෝ බහාලුම් නිෂ්කාශනය කරන ලද අතර ඉතිරිව තිබුණේ 187 ක් වන අතර අමාත්‍යාංශ අරමුදල් ප්‍රතිපාදන යටතේ මුදල් නිකුත් කිරීමට භාණ්ඩාගාරය එකඟ වී ඇති බැවින් නුදුරු අනාගතයේ දී එම බහාලුම්ද නිෂ්කාශනය වනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවයට අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට බලය පැවරීමට පෙර සියලු අසම්භාව්‍ය වගකීම් හඳුනාගෙන වාර්තා කළ යුතුය. |
| ii. | ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතියේ අතුරු ගෙවීම් සහතිකය අත්හිටුවීම වෙනුවෙන් අය කරන ලද එ.ජ.ඩො 1,002,488 ට සමාන රු. 372,531,531 ක මූල්‍ය පිරිවැය සඳහා ප්‍රතිපාදන 2022 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල සිදු කර නොතිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂයේ අලාභය රු. 372,531,531 කින් අඩුවෙන් දක්වා තිබුණි. | කොන්ත්‍රාත්කරු මෙම මුදල ගණනය කර ඇතත්, මණ්ඩලය එය ගෙවීමට හෝ ප්‍රතිපාදන සැලසීමට එකඟ වී නොමැත. හිමිකම් පෑම කමිටුවක් විසින් සමාලෝචනය කර ඇති අතර එය දැන් අගයමින් පවතී. | ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවයට අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට බලය පැවරීමට පෙර සියලු අසම්භාව්‍ය වගකීම් හඳුනාගෙන වාර්තා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| iii. | මනුගත විකුණුම් ආදායමට එරෙහිව ප්‍රාදේශීය සහයක මධ්‍යස්ථාන තුනක කපා හරින ලද බොල් ණය පියවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මනුගත විකුණුම් ආදායම රු. 9,081,345 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. | බොල් ණය කපා හැරීම විකුණුම් වියදම් ලෙස සැලකිය යුතු අතර වත්මන් ආදායමට එරෙහිව කපා නොදැමිය යුතුය. |
| iv. | මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ii සහ iii සම්බන්ධයෙන් වර්ෂය අවසානයේ දරන ලද රු. 12,327,095 ට සමාන එ.ජ.ඩො 35,357.08 ක බැදීම් ගාස්තු මණ්ඩලයේ ගිණුම් පොත්වල ගිණුම්ගත කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව, මෙය භාණ්ඩාගාරය විසින් දරා ඇත. එබැවින්, බැදීම් ගාස්තු කෙරීගෙන යන වැඩ ගිණුමට ගිණුම්ගත කර නොතිබුණි. | 2013 නොවැම්බර් 29 දිනැති අංක 230/2013 දරන චක්‍රලේඛය සහ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව, ඉදිකිරීම් කාලය තුළ දරන ලද ණය ගැනීමේ පිරිවැය අදාළ ව්‍යාපෘතියට ප්‍රාග්ධනීකරණය කළ යුතුය. |
| v. | දේශීය හා විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘති දාහතක ණය සඳහා උපචිත පොලී සම්බන්ධයෙන් බැංකුවලින් ලැබුණු තහවුරු කිරීම් හා සසඳන විට රු. 1,633,371,877 ක ඌන වෙන්කිරීමක් සහ රු. 1,221,181,323 ක අධි වෙන්කිරීමක් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, කෙරී ගෙන යන වැඩ ශේෂය රු. 412,190,554 කින් අඩුවෙන් දක්වා තිබුණි. | බැංකුව විසින් 2022.12.30 දිනට පොලී මුදල දන්වා ඇති අතර මෙම මුදල මූල්‍ය වර්ෂය අවසානයේ උපචිත කර ඇත. නමුත්, 2022.12.31 දිනට තත්‍ය පොලිය බැංකු තහවුරු කිරීම් මඟින් ලබා දී ඇත. එබැවින්, වෙනස ඇති විය හැකිය.<br>සී.ඩී.බී සහ එක්සිම් ණයවල උපචිත පොලී ඇස්තමේන්තුගත එල්.අයි.බී.ඕ.ආර් අනුපාතය භාවිතයෙන් ගණනය කර ඇති අතර තත්‍ය ණය ලබා දීම් සඳහා යොදා ගෙන ඇත. | වසර අවසානයේ බැංකුවලින් ලද ශේෂ තහවුරු කිරීම් සමඟ සංසන්දනය කළ යුතු අතර යම් ගැලපීමක් තිබේ නම් එය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| vi. | නැවත අයකර ගැනීමේ වැඩ සඳහා ලද රු. 8,849,176,996 ක අත්තිකාරම් මුදලින් රු. 3,100,107,155 ක මුදලක් වසර තුනක් පුරා හිලව් නොවී පවතී. නැවත අයකර ගැනීමේ වැඩවලින් ඉල්ලා සිටි රු. 795,722,766 ක මුදලින් රු. 263,218,934 ක මුදල සඳහා වන තොරතුරු පමණක් ලැබී තිබුණි. ලැබුණු තොරතුරු අතරින්, නිම කරන ලද වැඩ 8 ට අදාළව රු. 118,356,032 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දිනට ආදායම් ගිණුමට මාරු කර නොතිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂයේ අලාභය රු.118,356,032 කින් වැඩියෙන් දක්වා තිබුණි. | සම්පූර්ණ කිරීමේ සහතික පිලියෙල කරමින් පවතින අතර ඒවා ප්‍රාග්ධනීකරණය කිරීමට 2023 වර්ෂයේදී අවසන් කෙරේ. නැවත අයකර ගැනීමේ ව්‍යාපෘති කාලපරිච්ඡේදය සාමාන්‍යයෙන් වසර 3 කට වඩා වැඩි වේ. | සම්පූර්ණ කරන ලද නැවත අයකර ගැනීමේ ව්‍යාපෘති සඳහා ලැබුණු අත්තිකාරම් නිරවුල් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| vii. | ලද තොරතුරුවලට අනුව, පිරිවැය රු. 75,510,930,776 ක් වූ සම්පූර්ණ කරන ලද ඉදිකිරීම් සහ පුනරුත්ථාපන ව්‍යාපෘති ප්‍රාග්ධනීකරණය නොකර 2022 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතුණි. | සම්පූර්ණ කිරීමේ සහතික ප්‍රාග්ධනීකරණය කිරීමට පිලියෙල කරමින් පවතින අතර ඒවා 2023 වර්ෂයේදී සම්පූර්ණ කෙරේ. | මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම්වල නිවැරදි අගය පිළිබිඹු කිරීම සඳහා සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවල වටිනාකම ප්‍රාග්ධනීකරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| viii. | ඉදිරියට ගෙන ආ රු. 33,795,903 ක ආර්ථික සේවා ගාස්තුව සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ආදායම් බදු වියදම ලෙස වැරදි ලෙස හඳුනාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා තත්‍ය ආදායම් බදු වියදම් හඳුනා ගැනීම සඳහා ආදායම් බදු ගණනය සකස් කර නොතිබුණි. | පසුගිය වසරවල සිට ඉදිරියට ගෙන ආ අධික අඩු කළ හැකි බදු පාඩු මණ්ඩලයට සතුව ඇත. ආර්ථික සේවා ගාස්තුව හිලව් කිරීම සඳහා ආදායම් බදු වගකීමක් නොමැත. එබැවින්, ආර්ථික සේවා ගාස්තුව මණ්ඩලයට වියදමක් වන අතර ඒ අනුව එය විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කර ඇත. | හිමිකම් නොපෑ ආර්ථික සේවා ගාස්තුව වෙනත් වියදම් ලෙස ආදායම් ප්‍රකාශනය වෙත අය කළ යුතුය. |
| ix. | පිරිවැය මධ්‍යස්ථාන අටකට අදාළව, එකතුව රු. 125,540,714 ක වටිනාකමක් සහිත ස්ථාවර වත්කම් සත්‍යාපනය කළ නොහැකි වූ අතර භෞතිකව නොපැවතුණි. තවද, භෞතික සත්‍යාපන වාර්තාවලට අනුව, ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථානවල රු. 991,976,449 ක් වටිනා වත්කම් පැහැදිලිව හඳුනාගත නොහැකි විය. කෙසේ වෙතත්, මුදල් රෙගුලාසි අංක 102 සිට 105 දක්වා වූ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුව ක්‍රියාමාර්ග නොගෙන, සමාලෝචිත වර්ෂය තුළදී ක්ෂයවීම් සඳහා රු. 36,364,018 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. | සමහර තොග දැනටමත් වෙන්දේසිය සඳහා යවා ඇති සහ තොග සත්‍යාපන කාල සීමාව තුළ ගබඩා පරිශ්‍රයේ නොපැවති වෙන්දේසි කළ හැකි අයිතම නියෝජනය කරයි.<br>භෞතික පැවැත්ම නැවත තහවුරු කිරීම සඳහා කණ්ඩායමක් පත් කරනු ලබන අතර කමිටු තීරණය අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වත්කම්වල පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා සෑම ගබඩාවකම වත්කම් වාර්තා පැහැදිලිව තබා ගත යුතු අතර මූල්‍ය රෙගුලාසි අනුගමනය කිරීමෙන් පසු ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |
| x. | වෙනත් ණයගැතියෝ, අත්තිකාරම්, වෙළඳ ණයහිමියෝ, ඉල්ලුම් නොකළ වැටුප් යනාදිය ඇතුලත් දීර්ඝ කාලීනව පැවත එන පිළිවෙලින් රු.149,748,448 ක හා රු.51,287,805 ක හිග වත්කම් හා වගකීම් ශේෂ පවතී. එහි පැවැත්ම සඳහා හේතු හඳුනා ගැනීමට පියවර ගැනීමකින් තොරව ක්‍රියාකාරී නොවන වත්කම් හා ක්‍රියාකාරී නොවන වගකීම් ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවලට ඇති බලපෑම නිශ්චය කළ නොහැක. තවද, රු. 235,123,315 ක හඳුනා නොගත් පූර්ව වර්ෂ ශේෂයක්ද, | හස්තීය ක්‍රමය පරිගණක ගත කිරීම හේතුවෙන්, 1999 වර්ෂයේ සිට මෙම ශේෂයන් ඉදිරියට ගෙන එමින් තිබුණි. ඉහත කරුණු නිරවුල් කිරීම සඳහා විශේෂ කමිටු සැකසීම, පිළිගත් විගණන ආයතනවල සේවාවන් ලබා ගැනීම වැනි විවිධ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. මෙම ක්‍රියාවලින් මඟින් ලබාගත් ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් නිරවුල් විය. 2017 වර්ෂයේදී, නිරවුල් නොකළ ශේෂය අනාගතයේදී නිරවුල් කිරීම සඳහා වෙනම ගිණුමකට මාරු කර ඇත. | මූල්‍ය තත්ත්වය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී නොවන වත්කම් සහ වගකීම් ශේෂ නිරවුල් කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් මෙම කාරණය සම්බන්ධයෙන් අඛණ්ඩ පසු විපරම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.22,007,307 ක තොග ශේෂයක්ද, රු.8,343,056 ක බැංකු ශේෂයක්ද සහ අමාත්‍යාංශයට ලබා දී ඇති රු. 15,227,490 ක අත්තිකාරම් ශේෂයක්ද ඉහත සඳහන් ශේෂය තුල ක්‍රියාකාරී නොවන වත්කම් ලෙස පැවතුණි. | | |
| xi. | 2022 දෙසැම්බර් 31 දිනට අදාළ ඉඩම ප්‍රාග්ධනීකරණය කර තිබුණද ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථානය විසින් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවන ලද රු. 8,422,646 ක ඉඩම් අත්තිකාරම් මුදල පියවීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ආයතන කිහිපයක් සම්බන්ධ වී ඇති නිසා ඉඩම අත්පත් කර ගැනීම සඳහා වැඩි කාලයක් ගතවේ. එබැවින්, ඉඩම අත්පත් කර ගැනීම සඳහා තවත් වැඩි කාලයක් ගතවනු ඇත. එබැවින්, එය අත්පත් කරගත් විට අත්තිකාරම නිරවුල් වනු ඇත. | ප්‍රාග්ධනීකරණයේදී ඉඩම් අත්තිකාරම් පියවිය යුතුය. |
| xii. | විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති හතරක් සඳහා ලබාගත් ණය සම්බන්ධයෙන් වාරික සහ පොළී ආපසු ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් දරන ලද රු. 107,302,970 ක පැහැර හැරීම් පොළී ගිණුම්ගත කර නොතිබූ අතර, එම නිසා සමාලෝචිත වර්ෂය සඳහා වූ අලාභය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 මාර්තු සිට මේ දක්වා ගෙවා නොමැති ප්‍රාග්ධන ආපසු ගෙවීම් සහ පොලී ගෙවීම් මෙයට හේතු වී ඇත. | කාලපරිච්ඡේදයට අදාළ වියදම් ගිණුම් වෙත ගෙන යා යුතුය. |
| xiii. | ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වලට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා අදාළ රු. 17,579,677 ක පොලී ආදායමක් සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම ලෙස හඳුනාගෙන නොතිබූ අතර එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ අලාභය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ගිණුම්කරණ කාලපරිච්ඡේදයට අදාළ ආදායම ගිණුම් පොත්වලට ගත යුතුය. |
| xiv. | 2020 ජූලි 02 වැනි දින ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගත් රු. බිලියන 30 ට අදාළව 2020 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු. 40,425,035 ක පොලී මුදල මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. එබැවින්, 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, එම පිරිවැය භාණ්ඩාගාරය විසින් දරයි. තවද, එය මණ්ඩලය විසින් ගෙවන ලද පොලී ලෙස ගිණුම්ගත කර ඇත.<br>මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු පොලිය සම්බන්ධව කටයුතු කරන අකාරය පිළිබඳ ප්‍රතිපත්තිය 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කර ඇත. | භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් හඳුනාගැනීමේ වැරැද්ද නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| xv. | ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථානවල වත්කම් ලේඛනවල සටහන්ව ඇති ගොඩනැගිලි දෙකක්, ඉඩම් පහක්, ත්‍රිරෝද රථයක්, මෝටර් බයිසිකලයක්, ට්‍රැක්ටරයක් සහ ටේලර් එකක් තක්සේරු කර ගිණුම් පොත්වලට ගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | සියලුම වත්කම් ගිණුම් පොත්වලට ගත යුතුය. |
| xvi. | භූගත ජල අංශයේ නිම කරන ලද ළිං සඳහා ගෙවන ලද රු. 8,437,399 ක අත්තිකාරම් මුදල වියදම් ගිණුමට මාරු කර නොතිබුණි. එබැවින්, වියදම් එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඒවා වියදම් ගිණුමට මාරු කිරීම සඳහා ඉංජිනේරුවරයා විසින් සම්පූර්ණ කිරීමේ සහතිකය ලබා දිය යුතුය. සහතිකය ලැබුණු පසු එය වියදම් ගිණුමට මාරු කරනු ඇත. | නිම කළ වැඩ සඳහා අත්තිකාරම් පියවිය යුතුය. |
| xvii. | 2016 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය සඳහා අය කර ඇති ගෙවා නොමැති ආර්ථික සේවා ගාස්තු සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුව අනුව ගෙවිය යුතු ඉතිරි මුදල වූ රු. 66,369,263 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේදී පවා ගිණුම් පොත්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් ඇත. මේ වන විට මතු වී කරුණු අනුව අමතර බදු වගකීමක් ඇති වීමට ඉඩක් නොමැත. එබැවින්, මෙම ශේෂයට ප්‍රතිපාදන අවශ්‍ය නොවේ. | තක්සේරුව නැවත ඇගයීමට ලක් කරන ලෙස ඉල්ලා මණ්ඩලය විසින් යවන ලද ලිපියට පිළිතුරු නොලැබීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන සැලසීමට ක්‍රියා කළ යුතුය. |
| xviii. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට නව සම්බන්ධතා ණය ගැතියන් ඇතුළුව වෙළඳ ණය ගැතියන්ගේ ශේෂය රු. 8,450,830,193 කි. කෙසේ වෙතත්, රු. 8,269,217,708 ක් වූ ණය ගැතියන් සඳහා පමණක් හානිකරණ ප්‍රතිපාදන සලසා තිබුණි. එබැවින්, එකතුව රු. 181,612,485 ක් වූ ණය ගැතියන් සඳහා හානිකරණ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | හානිකරණ ගණනය කිරීම වාණිජ පද්ධතිය විසින් ලබා දී ඇති තත්‍ය සංඛ්‍යා මත පදනම් විය. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනයේ අංක 20 සටහනේ අනාවරණය කර ඇති ඇස්තමේන්තුගත ආදායම මත මූල්‍ය ප්‍රකාශනයේ වාර්තා කර ඇති ණයගැති ශේෂය පදනම් වේ. | මුළු ණයගැති ශේෂයන් සඳහා ප්‍රතිපාදන සැලසීම සහ ලෙජරය හා ණයගැති පද්ධතිය අතර කිසියම් වෙනසක් තිබේ නම්, වෙනස්කම් සඳහා හේතු හඳුනා ගැනීම සඳහා සැසඳීමක් සිදු කිරීම. |

### 1.5.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් සහ මණ්ඩලයේ වාණිජ අංශය විසින් ඉදිරිපත් කරන ලද වයස් විශ්ලේෂණ උපලේඛනවල දක්වා ඇති ශේෂයන් අතර වෙළඳ ණය ගැතියන්ගේ | නව සම්බන්ධතා ලෙජර ගිණුම් සැසඳීම සඳහා ප්‍රාදේශීය ගණකාධිකාරීවරුන්ට උපදෙස් ලබා දී ඇත. | පද්ධති දෙක අතර වෙළඳ සහ නව සම්බන්ධතා ණය ගැතියන් සැසඳීමට සහ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ ණය ගැතියන්ගේ |

| | | | |
|---|---|---|---|
| | රු. 89,736,141 ක සහ නව සම්බන්ධතා ණයගැතියන්ගේ රු. 91,876,971 ක වෙනසක් නිරීක්ෂණය විය. | | නිරවද්‍යතාවය සහතික කිරීමට කටයුතු කළ යුතුය. |
| ii. | වැට් බදු ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මනුගත විකුණුම්, තොග විකුණුම්, බවුසර් සැපයුම් සහ ප්‍රධාන මෙහෙයුම්වලින් ලැබෙන ආදායම අතර රු.1,972,333,220 ක නොසැසඳූ වෙනසක් නිරීක්ෂණය විය. | වාණිජ අංශයේ වාර්තා අතර නොගැලපෙන වෙනසක් නිරීක්ෂණය කරන ලද අතර මූල්‍ය ප්‍රකාශන දැනටමත් සැසඳීම් කර නිවැරදි කිරීමේ ජර්නල් වවුචර් ප්‍රාදේශීය ගිණුම් වෙත සටහන් කර ඇත. | වෙනස්කම් සඳහා හේතු හඳුනා ගැනීමට මූල්‍ය ප්‍රකාශනවල, වාණිජ පද්ධතියේ සහ වැට් බදු ප්‍රකාශනවල ප්‍රකාශිත ආදායමෙහි ශේෂයන් සැසඳීම සහ විකුණුම් සංඛ්‍යාවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා විගණකවරුන් වෙත සියලු විස්තර ඉදිරිපත් කිරීම. |
| iii. | නියැදි විගණනයේදී මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සහ අදාළ ව්‍යාපෘතිවල ඒ ඒ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා සසඳන විට විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති හයක විදේශ ප්‍රදානවල එකතුවෙහි රු. 35,868,992,967 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | වෙනස්කම් නිවැරදිව සැසඳීමට පියවර ගත යුතුය. |
| iv. | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඉදිකිරීම් කටයුතුවල කෙරීගෙන යන වැඩ ශේෂය සහ සබරගමුව ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථානය විසින් තහවුරු කරන ලද අනුරූප ශේෂයන් අතර එකතුවෙහි රු.65,511,961 ක වෙනසක් නිරීක්ෂණය විය. | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් සංඛ්‍යාව තත්‍ය සංඛ්‍යා සමඟ නොගැලපේ. ව්‍යාපෘති ණය මුදල්, මුදල ලබා ගැනීමෙන් පසු තත්‍ය පදනම මත සටහන් කරයි. නමුත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත යාවත්කාලීන කරයි. | වෙනස්කම් සඳහා සැසඳීම් සිදු කර, සිදු කළ යුතු වෙනස්කම් තිබේ නම් ගැලපීම් කිරීම. |
| v | නියැදි විගණනයේදී මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලබාගත් ණය ශේෂය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සීඑස්-ඩීආර්එම්එස් වාර්තාවේ දැක්වෙන අනුරූප ශේෂයන් අතර එකතුවෙහි රු.6,656,905,735 ක වෙනසක් නිරීක්ෂණය විය. | මණ්ඩලය උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති නමුත් සීඑස්-ඩීආර්එම්එස් වාර්තාවේ පෙන්වා ඇති අගය, වර්ෂය තුළ තත්‍ය ලැබීම් මත පදනම් වේ. ගෙවීම් යාවත්කාලීන කිරීමට සහ වාර්තා කිරීමට මහා භාණ්ඩාගාරයේ කාල වෙනසක් ඇත. | **වෙනස්කම් සඳහා හේතු හඳුනාගෙන ඒවා ගැලපීම් කිරීම.** |
| vi. | මණ්ඩලයේ ප්‍රාග්ධන දායකත්වයට අදාළව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය සහ මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය අතර | රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් හේතුවෙන් ණය ස්කන්ධය බවට පරිවර්තනය කර ඇත. ඒ අනුව, 2014.12.31 දිනට පැවති ණය ශේෂය ස්කන්ධය බවට පරිවර්තනය කර ඇත. | වෙනස්කම් සසඳා ඒ අනුව වාර්තාවලට ගැලපීම් කිරීම. |

| | | | |
|---|---|---|---|
| | රු.20,435,860,610 ක වෙනසක් හඳුනා ගන්නා ලදී. | තවද, පසුව අමාත්‍ය මණ්ඩලයෙන් ලද අනුමැතියට අනුව, අදාළ ණයවලින් 2014.12.31 දිනෙන් පසුව ලැබුණු මුදල්ද ස්කන්ධය බවට පරිවර්තනය කර ඇත. දෙපාර්ශ්වය විසින් අනුගමනය කරන ලද වෙනස් ගිණුම්කරණ ක්‍රම හේතුවෙන් ඉහත කී වෙනස නිර්මාණය විය. කෙසේ වෙතත්, සැසඳීම සිදු කර ඇත. | |
| vii. | මණ්ඩලයේ ශේෂ පිරික්සුමේ දැක්වෙන ශේෂය සහ ණයහිමියන්ගේ පාලන ගිණුමට අදාළව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද උපලේඛනවල දැක්වෙන ශේෂය අතර රු.2,742,556 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | වෙනස්කම් සසඳා ඒ අනුව වාර්තාවලට ගැලපීම් කිරීම. |
| viii. | 2022 දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල්වලට සමාන දෑ යටතේ නිරවුල් කිරීමෙන් තොරව මාස හයකට වඩා වැඩි කාලයක් තිස්සේ මාර්ගස්ථ මුදල් ගිණුමේ සහ ණයගැති එකතු කිරීමේ පාලන ගිණුමේ පිළිවෙලින් රු. 2,861,454 ක සහ රු. 220,718,661 ක නොසැසඳූ වෙනස්කම් පවතී. | බිල්පත්වල වටිනාකම සහ ප්‍රධාන කාර්යාලයට මාරු කරන ලද මුදල් හේතුවෙන් මෙම ගිණුමේ ශේෂය නිර්මාණය වී ඇත. ප්‍රධාන කාර්යාලයට සිදු කරනු ලබන මීළඟ මුදල් මාරුකිරීමේදී මෙය නිරවුල් වනු ඇත. | වෙනස්කම් සසඳා ඒ අනුව වාර්තාවලට ගැලපීම් කිරීම |
| ix. | නියැදි විගණනයේ දී, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරීගෙන යන වැඩ ශේෂය සහ විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති දහයක ඒ ඒ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූප ශේෂයන් අතර රු. 1,793,072,246 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | වෙනස්කම් සඳහා සැසඳීම් සිදු කර, සිදු කළ යුතු වෙනස්කම් තිබේ නම් ගැලපීම් කිරීම. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | වෙනත් ණයගැතියන් | 106,007,906 | විස්තරාත්මක උපලේඛන (217 සහ 219) | විස්තරාත්මක උපලේඛන දැනටමත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. | පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා වෙනත් ණය ගැතියන්, වෙනත් ණය හිමියන්, කෙටි |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | වෙනත් වෙළඳ ණය හිමියන් | 306,911,958 | විස්තරාත්මක උපලේඛන | විස්තරාත්මක උපලේඛන දැනටමත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. | කාලීන තැන්පතු, රඳවා ගැනීමේ බදු, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ අත්තිකාරම් සහ දෙපාර්තමේන්තුව විසින් පවරා ගන්නා ලද වත්කම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (iii) | වෙනත් ආයතනවල තබා ඇති කෙටිකාලීන තැන්පත් | 5,561,100 | විස්තරාත්මක උපලේඛන සහ පැවැත්ම සඳහා හේතු | පිළිතුරු සපයා නොමැත. | |
| (iv) | රඳවා ගැනීමේ බදු | 111,540,855 | විස්තරාත්මක උපලේඛන සහ සහතිකපත් | මණ්ඩලය විසින් ආදායම් බදු වාර්තාව ඉදිරිපත් කිරීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලැබිය යුතු රඳවා ගැනීමේ බදු මුදල පිලිබඳව දැනුම් දී ඇත. | |
| ( v) | රජයේ දෙපාර්තමේන්තු වෙන් පවරා ගත් වත්කම් | 185,480,387 | පවරා ගත් විස්තරාත්මක වත්කම් ලේඛණය | පිළිතුරු සපයා නොමැත. | |
| (vi) | භාණ්ඩාගාර ප්‍රදාන | 104,950,118,240 | ප්‍රදාන හා සම්බන්ධ ව්‍යාපෘතිය සමඟ විස්තරාත්මක උපලේඛන | විස්තරාත්මක උපලේඛන දැනටමත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. | |
| (vii) | ප්‍රාග්ධන ප්‍රදාන - පළාත් පාලන ආයතන | 1,107,413,083 | ප්‍රදාන හා සම්බන්ධ ව්‍යාපෘතිය සමඟ විස්තරාත්මක උපලේඛන | විස්තරාත්මක උපලේඛන දැනටමත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. | |
| (viii) | විදේශ ප්‍රාග්ධන ප්‍රදාන | 3,657,640,079 | ප්‍රදාන හා සම්බන්ධ ව්‍යාපෘතිය සමඟ විස්තරාත්මක උපලේඛන | විස්තරාත්මක උපලේඛන දැනටමත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. | |
| (ix) | ප්‍රදාන ක්‍රමක්ෂය | 2,797,207,561 | ප්‍රදාන හා | විස්තරාත්මක උපලේඛන | |

| | | |
|---|---|---|
| උපලේඛනය | සම්බන්ධ ව්‍යාපෘතිය සමඟ විස්තරාත්මක උපලේඛන | දැනටමත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | එකතුව රු. මිලියන 1,791.25 ක් වූ වෙළඳ ණයගැතියන්, නව සම්බන්ධතා ණයගැතියන්, මලාපවහන ණයගැතියන් සහ වෙනත් ණයගැතියන් වසර දෙකක් තිස්සේ අයකර ගැනීමකින් තොරව පැවතුණි. ඉහත වෙළෙඳ ණයගැතියන්ගෙන් සියයට 62 ක් බස්නාහිර දකුණ, බස්නාහිර උතුර සහ හම්බන්තොට ප්‍රදේශවලින් නියෝජනය කරයි. නව සම්බන්ධතා ණයගැතියන් වාරික 3 කින් අයකර ගැනීමට නියමිතව තිබියදීත්, රු. 5,658,157 ක් වසර 3 කට වඩා වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමකින් තොරව පැවතුණි. නව සම්බන්ධතා ණයගැතියන් තුළ ඇති රු. 15,569,200 ක අසාමාන්‍ය බැර ශේෂයක් විමර්ෂණය කර නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. තවද, ඉහත ශේෂය අතරින්, සභාධිපත්‍ය දේපලකට අදාළව රු. 5,666,581 ක හිඟ ශේෂයක් සහිත අංක. 10/12/806/508/19 දරණ සම්බන්ධතාවයක් කිසිදු වලංගු හේතුවක් නොමැතිව නිදහස් ජල කාණ්ඩයට මාරු කර තිබුණි. | මෙම වෙළඳ ණයගැතියන්ගෙන් සියයට 62 ක් කොළඹ, කැලණිය, කෝට්ටේ සහ හම්බන්තොට ප්‍රදේශ වලින් නියෝජනය කරයි. තවද, හිඟ ශේෂයන් ක්‍රමිකව වර්ධනය විය. හිඟ මුදල් අයකර ගැනීමට දැන් කටයුතු කර ඇත.<br>මෙම ශේෂයන් සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා සෑම මාස තුනකට වරක්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කරයි. | අභ්‍යන්තර චක්‍රලේඛවලට අනුව ණය ගැතියන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. අවශ්‍ය ක්‍රියා පටිපාටිය අනුගමනය නොකරන්නේ නම්, ක්‍රියා පටිපාටිය අනුගමනය නොකරන සේවකයින්ට එරෙහිව පියවර ගත යුතුය. |
| ii. | අමාත්‍ය නිල නිවාස සඳහා ලබාදී ඇති ජල සම්බන්ධතා 11 ක් සම්බන්ධයෙන් රු. 4,555,164 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයේදී අයකර ගැනීමකින් තොරව දීර්ඝ කාලීනව හිඟව පැවතුණි. | අදාළ අමාත්‍යාංශවලින් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර අභාවප්‍රාප්ත වූ අමාත්‍යවරුන්ගේ හිඟ මුදල් කපා හැරීමට ද කටයුතු කර ඇත. | අදාළ පාර්ශවයන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| iii. | 2022 දෙසැම්බර් 31 දිනට විසන්දි කරන ලද හිඟ ණයගැති ශේෂය රු. 1,622,784,509 කි. එයින් සියයට 73 ට සමාන රු. 1,200,139,220 ක මුදලක් ආපසු අයකර ගැනීමෙන් තොරව වසර දෙකක් තිස්සේ හිඟව පැවතුනි. | හිඟ මුදල් අයකර ගැනීමට දැනටමත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ | අයකර ගැනීමේ **ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා පියවර ගත යුතුය.** |

| | | | |
|---|---|---|---|
| | | විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුර සමඟින් විගණකාධිපති වෙත වාර්තාවේ පිටපතක් ඉදිරිපත් කර ඇත. | |
| iv. | ගාල්ල නගර සභාවේ වසර 19 ක සිට අයවිය යුතු නීතිවිරෝධී සම්බන්ධතා දෙකක් සම්බන්ධයෙන් රු. 1,765,352 ක හිඟ ශේෂයක් සහ වසර 5 කට වැඩි කොළඹ මහ නගර සභාවට අදාළව අයවිය යුතු රු. 28,519,949 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | මීට වසර 19 කට පෙර සීඑම්සී හි ජල අංශය මණ්ඩලයට පවරා ගෙන ඇත. ඒ අවස්ථාවේ බිල්පත් ක්‍රමයට සම්බන්ධතා ඇතුළත් කර නොතිබුණි. විමර්ශනයෙන් පසු ආදායම අලාභ ජල සම්බන්ධතා ගිණුම්වලට එකතු කර ඇත.<br>මේ වන විට ගාල්ල ප්‍රාදේශීකය විසින් ආදායම් අලාභ අයකර ගැනීමේ කටයුතු පසු විපරම් කරමින් පවතී. | අනවසර ජල සම්බන්ධතා නිසා සිදු වූ පාඩුව අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| v. | ණය ගැතියන් වෙත යවන ලද තහවුරු කිරීම විශ්ලේෂණය කිරීමේදී, එකතුව රු. 292,061,739 ක් වූ ගිණුම් 150 ක් අතරින් එකතුව රු. 135,262,006 ක් වූ ගිණුම් 53 ක් තහවුරු කර තිබුණි. ස්ථානය සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් එකතුව රු. 66,201,380 ක් වූ ගිණුම් 17 ක තහවුරු කිරීම් ආපසු ලැබී තිබුණු අතර, එකතුව රු.35,798,188 ක් වූ ගිණුම් 11 ක් මණ්ඩලයේ ශේෂයන් සමඟ එකඟ වී නොතිබුණි. | වෙළඳ ණයගැතිත් වූ පාරිභෝගිකයින්ගෙන් ඉල්ලා සිටින ලද තහවුරු කිරීම් සඳහා ප්‍රතිචාර නොදක්වයි. | මෙහෙයුම්වලදී පාරිභෝගිකයාගේ තත්‍ය ලිපිනය සත්‍යාපනය කිරීමට අවශ්‍ය වන අතර නිරීක්ෂණය කළ ශේෂ වෙනස්කම් වර්ගීකරණය කර හේතුව සොයා ගත යුතුය. |
| vi. | ලෙජර කේත අංක 242/0 යටතේ ලබා දී ඇති රු. 242,002,232 ක් වූ කොන්ත්‍රාත් අත්තිකාරම් මුදලින් රු. 98,122,773 ක් නිරවුල් කිරීමෙන් තොරව වසර තුනකට වැඩි කාලයක් තිස්සේ පැවතුණි. ඒවා අතරින් රු. 8,176,092 ක් ආයතනය නොපැවතීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට නොහැකි වී ඇත. අත්තිකාරම්වල අයකරගැනීමේ හැකියාව හඳුනාගැනීම සඳහා රු. 9,805,216 ක් වූ අත්තිකාරම් සඳහා ගොනු කර ඇති නඩු හයක් පිළිබඳව විගණනය සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි. | වරින් වර එය නිරවුල් වන නමුත් වැඩ සිදු කරන කාලය තුළදී ඉතිරි වැඩ පවතියි. | එම ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. අත්තිකාරම් ආපසු අයකර නොගෙන ගෙවීම සිදු කර ඇත්දැයි පරීක්ෂා කළ යුතුය. එය සිදුවී ඇත්නම් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| vii. | බාහිර ආයතනවල තැන්පත් කර තිබූ ආපසු ගෙවිය යුතු කෙටි කාලීන තැන්පතුවල එකතුව වන රු. 52,232,693 ක් වසර තුනක් තිස්සේ | 264/03/1/00/0 – 221,242.00, මෙම මුදල ආපසු ගෙවිය හැකි තැන්පතු ලෙස 2017 පෙබරවාරි | තැන්පතු සහ අත්තිකාරම්වල පැවැත්ම සමාලෝචනය කිරීමට |

| | | |
|---|---|---|
| අයකර ගැනීමෙන් තොරව හිඟව පැවතුණු අතර ඒවායින් රු.11,953,200 ක් අදාළ ලේඛණ නොපැවතීම හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී ඇත. තවද, රේඛීය අමාත්‍යාංශයට ලබා දුන් රු. 4,378,829 ක් වූ අත්තිකාරම් මුදල වසර නවයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව හිඟව පැවතුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා රේඛීය අමාත්‍යාංශයේ වගකීම් ප්‍රකාශනයේ එය පෙන්වා නොතිබීම නිසා මෙම අත්තිකාරම් ආපසු අයකර ගැනීමේ හැකියාව සැක සහිත වේ. | මාසයේදී මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවා ඇත. මෙම තැන්පතුව අයකර ගැනීම සඳහා 2022 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා ඇත. නමුත් මෙතෙක් කිසිදු පියවීමක් කර නොමැත. එබැවින්, මාර්ග සංවර්ධන අධිකාරියට ඉදිරියේදී කරනු ලබන ගෙවීම්වලදී මෙය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සහ අයකර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2022 දෙසැම්බර් 31 දිනට රු. 1,177,322,071 ක් වූ වෙළඳ සහ වෙනත් ණයහිමි ශේෂය පියවීමට කටයුතු කිරීමෙන් තොරව වසරකට වැඩි කාලයක් තිස්සේ පැවතුණි. මාතර අදියර IV ජල සම්පාදන ව්‍යාපෘතියට අදාළව රු. 292,174,896 ක් වූ උපචිත වියදම් ගිණුමේ ශේෂය පියවීමට කටයුතු කිරීමෙන් තොරව වසර තුනකට වැඩි කාලයක් තිස්සේ පැවතුණි. | වරින් වර එය නිරවුල් වන නමුත් වැඩ සිදු කරන කාලය තුළදී ඉතිරි වැඩ පවතී. | මණ්ඩලයේ සාමාන්‍ය ක්‍රියා පටිපාටියට අනුව වගකීම් පියවීමට ක්‍රියා කළ යුතුය. |
| ii. | රු. 17,454,939 ක් වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු අදාළ පාර්ශවන්ට නිදහස් කිරීමට හෝ ආදායමට බැර කිරීමට කටයුතු කිරීමෙන් තොරව අවුරුදු තුනක් තිස්සේ පැවතුණි. | මෙම කොන්ත්‍රාත්තුවල කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම හේතුවෙන් මෙම තැන්පතු නිදහස් කර නොමැත. | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු නිදහස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| iii. | 2022 දෙසැම්බර් 31 දිනට මාතර අදියර IV ව්‍යාපෘතියට අදාළව 2019 වර්ෂයට අදාළ ජාතිය ගොඩනැගීමේ බද්ද ලෙස රු. 80,509,796 ක් මණ්ඩලය විසින් ගෙවා නොතිබුණි. | රජයේ ප්‍රතිපාදන නොමැති වීම සහ රේඛීය අමාත්‍යාංශයෙන් ගෙවීම අනුමත නොකිරීම නිසා හිඟ මුදල වූ රු. 80,509,796 ක් ගෙවා නොමැත. | බද්ද වගකීම් නියමිත දිනවලදී ගෙවිය යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | රු. 163,809,973 ක් වූ ඉඩම් අත්පත් කර ගැනීමේ තැන්පතු මුදල වසර තුනකට වඩා වැඩි කාලයක් තිස්සේ ඒවා විමර්ශනය කර ආපසු අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව පැවතුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතා හේතුවෙන් එම මුදලින් රු. 43,515,989 ක් 2016 වර්ෂයේ සිට හඳුනා ගැනීමකින් තොරව පැවතුණි. රු. 5,041,738 ක් වූ බැර ශේෂය දීර්ඝ කාලයක් තිස්සේ නිරවුල් කිරීමෙන් තොරව තැන්පතු ගිණුමේ පවතී. | ඉඩම් අත්පත් කර ගැනීමේ තැන්පතු මුදල් වූ රු. 163,809,973 ක්, රු. 43,515,989.00 ක් සහ රු. 5,041,738.00 ක් සොයා ගැනීමට නොහැකි වූ බැවින් පැහැදිලි කිරීම් සැපයීම සඳහා ඒවායේ වැඩිදුර විස්තර අවශ්‍ය වේ. | හිඟ ශේෂයන් සඳහා හේතු සොයා බලා ඒවා කඩිනමින් පියවීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කළ යුතුය. |
| ii. | 2022 ඔක්තෝබර් 31 වැනි දිනට අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන සක්‍රීය නොවන හිටපු සේවකයන්ට ලබාදුන් රු. 17,535,788 ක ණය සහ අත්තිකාරම් වසර අටකට වැඩි කාලයක් තිස්සේ ගිණුම්වල පැවතුණි. කෙසේ වෙතත්, විගණනය මඟින් කරන ලද පරීක්ෂණයට අනුව, ණය සහ අත්තිකාරම් ලබාගෙන ඇති ඉහත සේවකයන්ගෙන් සියයට 90 කට වඩා වැඩි පිරිසකට නියමිත මුදල් අයකර ගැනීමෙන් තොරව විශ්‍රාම යාමට ඉඩ ලබාදී තිබුණි. | නියමිත ක්‍රියාපටිපාටිය අනුව විශ්‍රාම ගිය අයගෙන් මණ්ඩලයට අයවිය යුතු මුදල අයකර ගන්නා ලෙස මුදල් දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර, පසුව ඔවුන්ගේ පාරිතෝෂිකය ගෙවීම මුදල් දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. මියගිය සේවකයන්ට අදාළව මණ්ඩලයට ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමෙන් අනතුරුව පාරිතෝෂිකය නිදහස් කර ඇත. නමුත් පරිගණක පද්ධතිය නිසියාකාරව යාවත්කාලීන නොවීම නිසා නිවැරදි තොරතුරු අනාවරණය වී නොමැති බව පෙනී යයි. තනතුරෙන් ඉවත් වූ, සේවයෙන් ඉවත් වූ, සේවයෙන් තහනම් වූ සහ වැටුප් නොමැතිව නිවාඩු ලබා ඇති අයගේ පාරිතෝෂික මුදල් නිදහස් කර නොමැති අතර, ඔවුන්ගේ පාරිතෝෂිත දීමනාව මුදා හරින අවස්ථාවේදී ලැබිය යුතු මුදල් එකතු කරනු ලැබේ. මණ්ඩලයේ අනෙකුත් අදාළ දෙපාර්තමේන්තුවල සහාය ඇතිව පමණක් මෙය සිදු කළ හැකිය. | එම ශේෂයන් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර එය අයකර ගැනීමට නොහැකි වුවහොත් ලැබිය යුතු මුදල් අයකර නොගෙන සේවකයින්ට විශ්‍රාම යාමට ඉඩ දුන් සේවකයින්ට එරෙහිව පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| i. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය රෙගුලාසිවල වගන්ති අංක 104 (3), (4) | වාහන අංක 253-5482, පීජී- 5419, පීජී- 6018 අදාළ රිය අනතුරු සඳහා රක්ෂණයෙන් අයකර නොගත් රු. 778,335 ක අලාභය අය කර ගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | මූල්‍ය රෙගුලාසිවලට අනුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| ii. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII ඡේදයේ 1.8, 4.6 සහ 7.4 වගන්තිය | සේවය හැර ගිය, ඉල්ලා අස්වූ සහ සේවයෙන් පහ කර සේවකයින් දාහතක් සඳහා වැටුප් ලෙස එකතුව රු. 945, 883 ක් වසර තුනක කාලයක් තිස්සේ ගිණුම් පොත්වල ඇතුළත් කර තිබුණි. එහෙත්, ඔවුන්ගේ පුද්ගල වැටුප් සඳහා ඔවුන්ට හිමිකමක් නොමැත. | අදාළ සිද්ධීන් අවසන් කිරීමෙන් පසු මෙම මුදල ආදායම් ප්‍රකාශනයට පැවරීමට කටයුතු කරනු ලැබේ. | මෙම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| iii. | පූර්ණ වැටුප් අධ්‍යයන නිවාඩු සඳහා නිලධාරීන් විසින් අත්සන් කරන ලද ගිවිසුමේ 13 (ආ) ඡේදය සහ ආයතන සංග්‍රහයේ XV (2013) පරිච්ඡේදයේ 4.7 වගන්තිය | අධ්‍යයන නිවාඩුව අවසන් වීමෙන් පසු මණ්ඩලයට අඛණ්ඩව සේවය සැපයීමට නොහැකි වූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් ශිෂ්‍යත්ව සඳහා කරන ලද වියදම්වල වටිනාකම මණ්ඩලයට ආපසු ගෙවා නොතිබුණි. බැඳුම්කර වටිනාකම රු. 20,190,832 කි. | එය නිරවුල් කිරීමට කටයුතු කරමින් ඇත. | ගිවිසුම් කොන්දේසි අනුව මණ්ඩලය විසින් කරන ලද වියදම් සේවකයාගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| iv. | 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතේ වගන්ති අංක 5.1 | ඒකාබද්ධ අරමුදලට ලාභාංශ හෝ බදු බෙදා හැරීමෙන් තොරව ප්‍රසාද දීමනාව වෙනුවට නිෂ්පාදන දිරි දීමනාව ලෙස රු. 269,323,092 ක් ගෙවා තිබුණි. | මෙය ප්‍රසාද දීමනාවක් නොව භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව ගෙවන ලද දිරි දීමනාවකි. | මෙහෙයුම් අත්පොතෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වීම. |
| v. | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර | මණ්ඩලයේ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සහ උසස් කිරීමේ ක්‍රියා පටිපාටිය සඳහා අනුමැතිය 2023 මාර්තු මාසය අවසන් වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය අවසන් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. නමුත්, ඉදිරිපත් කර ඇති බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය පිළිබඳව පැති | **කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන්** බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.2(i) වගන්තිය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 මැයි 23 දිනැති අංක ඩීඑම්එස්/ඊ2/19/4/064 දරන ලිපිය | නොතිබුණි. | කිහිපයක් යටතේ වෘත්තීය සමිති කිහිපයක් විසින් ගැටලු මතු කර ඇති අතර එම නිසා සංශෝධන සඳහා තම යෝජනා ඉදිරිපත් කිරීමට වෘත්තීය සමිතිවලට අවස්ථාව ලබා දී ඇත. මෙම සංශෝධන සාකච්ඡා කර අවසන් කළ පසු සංශෝධිත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ඇත. | **සඳහා අනුමැතිය ලබා ගැනීම.** |
| vi. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2020 හි 02(ii) සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක S/253/2020-877, S/21/2021-882 සහ S/291/2021-892 මත පාදක වූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය | මණ්ඩලයේ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට එරෙහිව 2021 සහ 2022 වර්ෂවලදී කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 176 ක් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබූ අතර 2022 ජූලි 31 දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු. 216,711,905 ක් එම සේවකයින් සඳහා ගෙවා තිබුණි. | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට එරෙහිව කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 176 දෙනෙකු බඳවා ගැනීම සඳහා 2023 සැප්තැම්බර් දක්වා දීර්ඝ කිරීම් ලබා ගෙන තිබුණි. | කොන්ත්‍රාත් සේවකයින් සඳහා කළමනාකරණ සේවා අනුමැතිය ලබා ගත යුතුය. |
| vii. | 2020 ජනවාරි 27 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | | | |
| | • ඡේද අංක 1.2 | සභාපති සහ උප සභාපති එක් වාහනයක් වෙනුවට වාහන දෙකක් භාවිත කරයි. තවද, මහා භාණ්ඩාගාර ලේකම්වරයා වෙත යොමු නොකර මණ්ඩලයේ වාහන ප්‍රතිපත්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අංක 5/15/2022-898 අනුව සභාපතිවරයාට වාහන තුනක් සහ උප සභාපතිවරයාට වාහන දෙකක් වෙන් කර තිබුණි. | අවශ්‍යතාවය අනුව වාහන අංශවලට වෙන් කරයි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූල වීම. |
| | • ඡේද අංක 1.4 | මහා භාණ්ඩාගාර ලේකම්වරයා වෙත යොමු නොකර අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සටහන් අංක 4201 (බී) යටතේ 2021 ජනවාරි | අමාත්‍යාංශ ලේකම්වරයා හරහා අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබාගෙන ඇත. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අවශ්‍යතාවයට |

| | | | | |
|---|---|---|---|---|
| | | මාසයේ සිට මණ්ඩලයේ සභාපතිවරයාට සහ උපසභාපතිවරයාට මසකට ලීටර් 150 ට අමතරව රු. 60,000 ක ඉන්ධන අත්තිකාරමක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය කර තිබුණි. | | අනුකූල වීම. |
| viii | කාර්යාල නිල නිවාස සංග්‍රහයේ 12.2 වගන්තිය සහ 2015 නොවැම්බර් 30 දිනැති මණ්ඩල චක්‍රලේඛ අංක ඒඩී18/2015 හි 3 වැනි වගන්තිය | වැටුපෙන් සියයට 10 ක අධිභාරයක් සහිත මාසික බිල්පත් වටිනාකම, ජල බිල්පත් හිඟ සේවකයින්ගෙන් අය කළ යුතුය. කෙසේ වෙතත්, මාස තුනක කාලයක් සඳහා නොගෙවූ ජල බිල්පත් ගාස්තු රු. 1000 ඉක්මවන සම්බන්ධතා 168 කින් අධිභාරය සහිතව එකතුව රු. 809,142 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මණ්ඩලයේ චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූල වීම සහ චක්‍රලේඛ අවශ්‍යතා අනුගමනය නොකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගෙන හිඟ මුදල් අයකර ගත යුතුය. |
| ix. | 2021 දෙසැම්බර් 03 දිනැති අංක 29/2021 දරන මණ්ඩල චක්‍රලේඛය | නියැදි විගණනයේදී, නිසි පරිදි වැටුප් රහිත නිවාඩු වාර්තා නොකළ සේවකයින් 35 දෙනෙකු සඳහා රු. 797,656 ක් 2022 වර්ෂයේදී ප්‍රසාද දීමනාවක් ලෙස ගෙවා ඇති බව හෙළිදරව් විය. | පිළිතුරු සපයා නොමැත. | මණ්ඩලයේ චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූල වීම සහ චක්‍රලේඛ අවශ්‍යතා අනුගමනය නොකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| x. | සාමාන්‍යාධිකාරිවරයාගේ චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ | | | |
| | • 2015 අගෝස්තු 12 දිනැති පාලන/ 12/2015 | විසන්ධි කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත හිඟ ණයගැතියන්ගෙන් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. කෙසේවෙතත්, රු.50,000 ට වඩා වැඩි බිල්පත් වටිනාකමක් සහිත විසන්ධි කරන ලද ණයගැතියන් 4,932 ක් සම්බන්ධයෙන් එකතුව රු. මිලියන 784.5 ක් වන හිඟ ණයගැති ශේෂය අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි. තවද, විසන්ධි කර වසර 3 ත් 12 ත් අතර කාලයක් ගතවී ඇතත් නැවත සම්බන්ධතාවක් | නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එය ක්‍රියාත්මක වෙමින් පවතී. විස්තර විගණනයට ලබා දෙනු ඇත. | චක්‍රලේඛ අවශ්‍යතාවය අනුගමනය කළ යුතුය. |

ලබාගෙන නොතිබුණද රත්නපුර දිස්ත්‍රික්කයේ රු. 420,312 ක හිඟ බිල්පත් වටිනාකමක් සහිත රජයේ නිල නිවාස 09 ක් සඳහා ප්‍රධාන මාර්ගයෙන් ජල සැපයුම විසන්ධි කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.9 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 1999 සිට 2006 දක්වා වර්ෂයන් තුළ ත්‍රිකුණාමලය, කැලණිය සහ අම්පාර ප්‍රාදේශිකවල සිදු කරන ලද රු. මිලියන 246.64 ක මුදල් වංචාවන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. කෙසේ වෙතත්, ත්‍රිකුණාමලය ප්‍රාදේශිකය හා සම්බන්ධව රු. මිලියන 171.9 ක මුදල් වංචාව අතරින් රු.මිලියන 24.15 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ණය ගැතියන් ලෙස වාර්තා කොට තිබුණි. තවද, 2001 වර්ෂය තුළ බණ්ඩාරවෙල ප්‍රාදේශිකයේ සිදු කළ රු. 272,735 ක තවත් මුදල් වංචාවක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් වගකිව යුතු පුද්ගලයින්ගෙන් අය කරගෙන නොතිබුණි. | ත්‍රිකුණාමලය කාර්යාලයේ මුල්‍ය වංචාව සම්බන්ධයෙන් ත්‍රිකුණාමලය මහාධිකරණයේ නඩු 08ක් පවරා ඇත. කැලණිය කාර්යාලයේ මූල්‍ය වංචාව සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කොළඹ මහාධිකරණයේ නඩුවක් පවරා ඇත. මෙම නඩු අතරින් එක් නඩුවකට අදාළ අලාභය, මණ්ඩලයට අලාභය ගෙවා දැමීමෙන් අනතුරුව පියවා ඇත. තවද, නීතිපති දෙපාර්තමේන්තුවද අවශ්‍ය පරිදි කරුණු විමසා ඇති අතර අනෙකුත් නඩු සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් මත නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | අනාගතයේදී එවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි ඇති බවට සහතික වීම සහ මණ්ඩලයට සිදු වූ සියලුම පාඩු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ආයෝජන තීරණයක් නොගෙන 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි කිරීමේ ගිණුම් අංක 2000934 හි රු. 49,846,688 ක ශේෂයක් පැවතුණි. ගිණුමේ සෑම මාසයකම සාමාන්‍ය ශේෂය රු. මිලියන 33 ක් පමණ වන අතර මණ්ඩලයේ ආයෝජන තීරණ ආයෝජන කමිටුව වෙනුවට මණ්ඩලයේ එක් සේවකයෙකු මත පමණක් රඳා පවතී. තවද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.2 ඡේදයට අනුව මණ්ඩලයේ ආදායම රු. බිලියන 35 ක් ඉක්මවා තිබියදී පවා ආයෝජන කමිටුවක් පිහිටුවා නොතිබුණි. තවත් රු. 1,500,082.86 ක් වෙනත් ඉතිරි කිරීමේ ගිණුමක (ගිණුම් අංක 2002283) දීර්ඝ කාලයක සිට කිසිදු චලනයකින් සහ ආයෝජන තීරණයකින් තොරව පැවතුණි. | මෙම ශේෂය 2023 දී ආයෝජනය කිරීමට කටයුතු කරනු ඇත. | සංවිධානයේ අරමුදල් ඵලදායී ලෙස කළමනාකරණය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3, 063,953,871 ක බදු පෙර ශුද්ධ අලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය රු. 3,054,327,099 ක් (නැවත පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව) විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 9, 626,771 ක අලාභයේ වැඩිවීමක් නිරීක්ෂණය විය. පසුගිය වසරට සාපේක්ෂව පරිපාලන වියදම් සහ මූල්‍ය පිරිවැය පිළිවෙලින් සියයට 5 කින් සහ සියයට 421 කින් වැඩි වීම සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් සහ ඉපැයීම් සියයට 21 කින් අඩුවීම මෙම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. කෙසේ වෙතත්, ගාස්තු වර්ධක සමග මනුගත විකුණුම්, තොග සහ බවුසර් විකුණුම් සංසන්දනාත්මකව වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස දළ ලාභය පෙර වසරට වඩා සියයට 26 කින් වැඩි විය. සියයට 12 සිට සියයට 643 දක්වා වූ අයවැය සහ තත්‍ය ආදායම හා වියදම් සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. එබැවින්. අයවැය කළමනාකරණ පාලනයේ ඵලදායී මෙවලමක් ලෙස භාවිත කර නොමැති බව නිරීක්ෂණය විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරු වලට අනුව, ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් **විෂයයන්වල** විශ්ලේෂණය පහත පරිදි වේ.

| විස්තරය | විචලන වටිනාකම වැඩි වීම/ (අඩු වීම) (රු.මි.) 2022 | 2021 | විචලනය % | විචලනයට හේතු |
|---|---|---|---|---|
| මනුගත විකුණුම් | 32,533 | 25,258 | 29 | ගාස්තු අනුපාතයන් වැඩි වීම, දී ඇති නව ජල සම්බන්ධතා වැඩි වීම, ගෘහස්ථ පරිභෝජනය වැඩිවීම, බවුසර් ජල සැපයුම වැඩි වීම ආදිය. |
| විකුණුම් පිරිවැය | 23,145 | 19,163 | 21 | පොම්ප කිරීමේ පිරිවැය, රසායනික පිරිවැය, අලුත්වැඩියා හා නඩත්තුව, කුලී හා වරිපනම් යනාදිය ඉහළ යාම. |
| වෙනත් මෙහෙයුම් ආදායම් හා ඉපැයීම් | 1,289 | 1,796 | (28.21) | මළාපවහන, භූගත ජල ආදායම, අධිභාර හා දඩ ඇතුළු විවිධ ආදායම් අඩු වීම ආදිය. |
| පරිපාලන වියදම් | 14,450 | 13,715 | 5 | කාර්ය මණ්ඩල පිරිවැය, අලුත්වැඩියා, නඩත්තු හා ආයතන වියදම් වැඩි වීම. |
| මූල්‍ය පිරිවැය | 3,917 | 752 | 421 | පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ණය ගැනීම් ඉහළ යාම, සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වාරික සහ පොළී අනුපාත සැලකිය යුතු මට්ටමකින් ඉහළ යාම. |

## 2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා මණ්ඩලයේ වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

| වර්ෂය | 2022 | 2021 නැවත පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව |
|---|---|---|
| දළ ලාභ ආන්තිකය | 35 | 34 |
| ශුද්ධ ලාභ ආන්තිකය | (9) | (11) |
| ජංගම අනුපාතය (වාර ගණන) | 0.67 | 1.40 |
| ද්‍රවශීලතා අනුපාතය (වාර ගණන) | 0.57 | 1.22 |
| මුළු වත්කම් පිරිවැටුම (වාර ගණන) | 0.04 | 0.04 |

ඉහත තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳ ප්‍රධාන මූල්‍ය අනුපාත ඉකුත් වර්ෂයට සාපේක්ෂව අවාසිදායක තත්ත්වයක් පෙන්නුම් කර තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ලබා ගත් ණය සඳහා පොලී අනුපාත වැඩිවීම, කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවිය යුතු හිඟ මුදල් සහ ණය ශේෂයන් ඉහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද, ප්‍රධාන වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී විදේශ ණය නිරාවරණය වැඩිවීම සහ ණය වාරික නොගෙවීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ මුළු හිඟ ණය ශේෂය රු. බිලියන 240 සිට රු. බිලියන 335 දක්වා එනම් සියයට 140 කින් ඉහළ ගොස් තිබුණි. එබැවින්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව ස්කන්ධයට ණය අනුපාතය සියයට 48 සිට සියයට 63 දක්වා එනම් සියයට 15 කින් වැඩි වී තිබුණි. 2022 අගෝස්තු මාසයේ සිට ජල ගාස්තු වැඩි කිරීම හේතුවෙන් ශුද්ධ අලාභය ඉකුත් වර්ෂයට වඩා සියයට දෙකකින් අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. 2020-2025 සඳහා වූ සංයුක්ත සැලැස්මට අනුව ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ "සැමට ජලය" යන සංකල්පය සමඟ ඒකාබද්ධව වර්ෂය සඳහා 327,685 ක නව සම්බන්ධතා ඉලක්කයක් ස්ථාපිත කර තිබූ අතර පසුව එම ඉලක්කය 2022 වර්ෂය තුළදී 190,000 දක්වා සංශෝධනය කර තිබුණි. කෙසේ වෙතත්, වර්ෂය තුළදී නව | සැමට ජලය වැඩසටහනේ විෂය පථය, ධාරිතාව වැඩි කිරීමේ සහ බෙදා හැරීම පුළුල් කිරීමේ වැඩසටහන සමඟ ආදේශනය කර ඇත. එබැවින්, ආරම්භක විෂය පථය සංකෝචනය වී ඇත. | සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධතා 153,217 ක් ලබා දී තිබුණි. තවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව නව සම්බන්ධතා සංඛ්‍යාව සියයට 20.24 කින් අඩු වී තිබියදී මනුගත විකුණුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 29 කින් වැඩි වී තිබුණි. | | |
| ii. | මණ්ඩලයේ පාරිභෝගික ප්‍රඥප්තියට අනුව, නව සම්බන්ධතාවයේ දින සිට දින 30 ක් ඇතුළත පළමු බිල්පත පාරිභෝගිකයා වෙත නිකුත් කළ යුතුය. කෙසේ වෙතත්, 2023 පෙබරවාරි 09 වැනි දිනට අවස්ථා 162 කදී කලාප හතරක (කෝට්ටේ, කළුතර- මොරන්තුඩුව, මහරගම - කැස්බෑව, කැලණිය) පළමු බිල්පත භාරදීමේදී දින 61 සිට දින 163 දක්වා වූ පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | කිසිදු අසාමාන්‍ය ප්‍රමාදයකින් තොරව පළමු බිල්පත පාරිභෝගිකයා වෙත ලබාදීමට පියවර ගෙන ඇත. | මණ්ඩලයේ පාරිභෝගික ප්‍රඥප්තියේ ප්‍රතිපාදනවලට අනුකූල වන බවට සහතික වීම සහ අඛණ්ඩව සිදුවන එවැනි අසාර්ථකවීම් වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි ශක්තිමත් කළ යුතුය. |
| iii. | ගාල්ල ප්‍රදේශයේ අපජල අපහරණ ව්‍යාපෘතිය යටතේ අපජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම සඳහා මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරියාගේ නිර්දේශය මත 2014 අප්‍රේල් මාසයේදී මණ්ඩලය විසින් තක්සේරු වටිනාකමින් රු. මිලියන 21.45 ක් හෙවත් සියයට 30 ක අත්තිකාරමක් එක් ඉඩම් හිමියෙකුට ගෙවා තිබුණි. පසුව, ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් ඇති වූ ආරවුලක් හේතුවෙන්, ගෙවූ අත්තිකාරම් මුදල අයකර ගැනීමට අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. තවද, ඉඩම් හිමියා විසින් ඉඩම මිලදී ගැනීමට පෙර එම ඉඩම මණ්ඩලයට විකිණීමට ඉඩම් හිමියාගේ කැමැත්ත ලබාදී තිබූ බව නිරීක්ෂණය විය. ඊට අමතරව, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ඉඩමේ ඇතැම් පවුල් පදිංචිව සිටි බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, 2022 ජුලි 31 දින වන විටත්, ඉඩම් හිමියාගෙන් ගෙවූ අත්තිකාරම්, ඒ සඳහා දඩ මුදල් අයකර ගැනීමට සහ මණ්ඩලයේ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු පියවරක් ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | අත්තිකාරම් මුදල් අයකර ගැනීම සඳහා අධිකරණයේ ගොනු කර ඇති නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතින අතර විමර්ශනයෙන් පසු නීති නිලධාරියාට අනතුරු ඇඟවීමේ ලිපියක් නිකුත් කර තිබුණි. | මණ්ඩලයේ වත්කම්වල අයිතිය සුරක්ෂිත බවට සහතික වීම සහ ආරවුලක් ඇති වූ ඉඩම් මිලදී ගැනීමට නිර්දේශ කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීම. |
| iv. | පොතුවිල් භාර නිලධාරී කාර්යාලයේ තිබුණු රු. මිලියන 10 ක් වටිනා බූව්බල් කැමරා පද්ධතියක් 2017 ජූලි 03 දින අක්කරෙයිපත්තුව කළමණාකාර කාර්යාලයට යවා තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් මාසය අවසන් වන | එය අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී. | කැමරාව අලුත්වැඩියා කිරීමට පියවර ගැනීම සහ භාණ්ඩ සමීක්ෂණයේදී කැමරාව සත්‍යාපනය නොවීමට හේතුව පරීක්ෂා |

| | | | |
|---|---|---|---|
| | විටත් එය අලුත්වැඩියා කර නොතිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු කළමණාකාර කාර්යාලයේ භෞතික සත්‍යාපනයේදී එය හඳුනාගෙන නොතිබුණි. | | කිරීම. |
| v. | පිරිවැය මධ්‍යස්ථාන අතර පැවරූ රු. 43,500,242 ක වත්කම් මූලික පිරිවැය මධ්‍යස්ථානවල ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. එබැවින්, එම වත්කම්වල වගකීම් එම වත්කම් භාවිතා නොකරන පිරිවැය මධ්‍යස්ථාන වෙත පැවරේ. | විගණන විමසුම සමඟ එකඟ වන අතර වත්කම් එක් පිරිවැය මධ්‍යස්ථානයකින් තවත් පිරිවැය මධ්‍යස්ථානයකට මාරු කිරීමේදී වත්කම් පැවරීමේ ආකෘති පත්‍ර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇත.<br>නිවැරදි පියවරයන් ලෙස නිසි වාර්තා තබා ගැනීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | වත්කම් පැවරීම සම්බන්ධයෙන් නිසි වාර්තා තබා ගැනීමේ වගකීම එම පිරිවැය මධ්‍යස්ථාන භාර නිලධාරියාට පැවරිය යුතුය. |
| vi. | 2014 ඔක්තෝබර් 10 වැනිදා සිට කොළඹ දකුණ කාර්යාල අවකාශය සඳහා කොළඹ මහ නගර සභාව සමඟ බදු කුලිය මණ්ඩලය විසින් සංශෝධනය කර නොතිබුණි. තවද, 2014 ඔක්තෝබර් සිට මේ දක්වා කුලී සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගිවිසුමක් පවතින අතර එය විගණකාධිපතිවරයාට ඉදිරිපත් කරනු ඇත. | ගිවිසුමේ කොන්දේසි අනුගමනය කළ යුතුය. |
| vii. | රු. 11,276,750 ක් වූ සේවක ආරක්‍ෂක තැන්පතුවෙන් රු. 7,434,562 ක් විශ්‍රාමික සේවකයින්ගේ ආරක්‍ෂක තැන්පතුවෙන් සමන්විත වන අතර එය විශ්‍රාම යාමේදී පියවා නොතිබුණි. තවද, 1980 ඔක්තෝබර් 07 දිනැති මණ්ඩල චක්‍රලේඛ අංක 80/28, අගයන් වැඩි දියුණු කිරීම සඳහා යාවත්කාලීන කර නොතිබූ අතර චක්‍රලේඛයේ හඳුනාගත් තනතුරු 14 වෙනුවට තනතුරු දෙකක් සඳහා පමණක් ආරක්ෂක තැන්පතු ලබාගෙන තිබුණි. | සේවකයින් විශ්‍රාම ගැනීමෙන් පසු, නිෂ්කාශන වාර්තාව ලබා ගැනීම මඟින් සියලුම ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට යම් කාලයක් ගතවනු ඇත. එබැවින්, ආරක්ෂක තැන්පතුව පියවීමට යම් කාලයක් ගත විය හැකිය.<br>චක්‍රලේඛය සංශෝධනය කරනු ඇත. | සේවකයින් විශ්‍රාම ගිය විට ආරක්ෂක තැන්පතු නිරවුල් කළ යුතු අතර යාවත්කාලීන කොන්දේසි සඳහා චක්‍රලේඛය සංශෝධනය කළ යුතුය. |
| viii. | 2022 දෙසැම්බර් 31 දිනට ගබඩා පහක (කැබිතිගොල්ලෑව, පදවිය, අනුරාධපුර සීකේඩී ගබඩා, පොළොන්නරුව සීකේඩී ගබඩා, කොළොන්න) පැවති රු. 51,250,416 ක් වූ තොග, තොග කළමනාකරණ පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. | 2022.12.31 වන විට ආර්එස්සී-එන්සී හි ගබඩා හතරක් (කැබිතිගොල්ලෑව, පදවිය, අනුරාධපුර සීකේඩී ගබඩා, පොළොන්නරුව සීකේඩී ගබඩා) පරිගණක ගත කර නොතිබූ බවට වූ විගණකගේ අදහස්වලට අපි එකඟ වේ. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ ක්‍රියාවලියට සම්බන්ධ මානව සම්පත් හිඟකම | මේ සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය. පසුව, අදාළ සියලු ගැටලු සඳහා අවධානය යොමු කර ඇත. | |
| ix. 2022 දෙසැම්බර් 31 වැනි දිනට යල්පැනගිය, ප්‍රයෝජනයට ගත නොහැකි සහ චලනය නොවන තොග පිළිවෙළින් රු. 4,030,131 ක්, රු. 210,294,082 ක් සහ රු. 647,357,338 ක් මණ්ඩලය විසින් අපහරණය කර නොතිබුණි. තවද, තොග පමාවූ කාලය හඳුනා ගැනීමට වයස් විශ්ලේෂණ මණ්ඩලය විසින් විගණනය සඳහා ලබා දී නොතිබුණි. | යල්පැනගිය, ප්‍රයෝජනයට ගත නොහැකි සහ චලනය නොවන අයිතම අපහරණය කිරීම සඳහා, තොග කළමනාකරණ ක්‍රියා පටිපාටි අත්පොතේ 7 වැනි වගන්තිය අනුව සෑම වසරකම භෞතික තොග සත්‍යාපනයෙන් අනතුරුව පශ්චාත් තොග සත්‍යාපනය සිදු කර ඇත. 2023 දී ද එම ක්‍රියාවලියම අනුගමනය කෙරේ. තවද, තොග වයස් විශ්ලේෂණය ලබා ගැනීම සඳහා අයි.එම්.එස් පද්ධතියේ පද්ධති වර්ධනයන් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. | තොග කළමනාකරණ ක්‍රියා පටිපාටි අත්පොතෙහි දක්වා ඇති උපදෙස් අනුව එම අයිතම නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| x. පිළිවෙළින් 2018 සහ 2019 වර්ෂයේ සිට තොග කළමනාකරණ ක්‍රියාපටිපාටිය අත්පොතේ 6.1.3(2) ප්‍රකාරව කොහුවල සහ කළුතර කාර්යාල භාර නිලධාරී කාර්යාලයේ තොග හිඟය වූ පිළිවෙළින් රු. 2,468,141 ක් සහ රු. 1,129,272 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | දැනටමත් පියවා ඇති මුදල රු. 512,644.32 කි.<br>පියවිය යුතු ඉතිරි මුදල රු. 616,627.68 කි.<br>මෙම කාරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනය මඟින් විමර්ශනය කරමින් පවතී, විමර්ශනයෙන් පසු ශේෂය නිවැරදි කරනු ඇත. | තොග කළමනාකරණ ක්‍රියාපටිපාටි අත්පොතෙහි අවශ්‍යතාවලට අනුකූල වීම. |
| xi. ප්‍රාදේශීය සහායක මධ්‍යස්ථානවල භෞතික සත්‍යාපන වාර්තාවලට අනුව, එකතුව රු. 92,334,466 ක් වූ ගොඩනැගිලි, ව්‍යුහයන්, යටිතල පහසුකම්, පරිගණක හා වෙනත් උපකරණ, මිනින්දෝරු උපකරණ, ජංගම උපකරණ යනාදිය හානි වී තිබුණු අතර ඒවා භාවිතයෙන් ඉවත් කර පිරිවැය මධ්‍යස්ථාන එකොළහකින් ඉවත් කර ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඒවා අපහරණය කිරීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පොත්වලින් ප්‍රකාශිත වත්කම් නිරවුල් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමේ දීර්ඝ ප්‍රමාදය හේතුවෙන්, ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා වැඩබිම් කාර්යාල මට්ටමින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සැකසීම සඳහා ආදේශක වැඩසටහනක් සකස් කර ඇත.<br>අනුමැතිය ලබා ගැනීමෙන් පසු, අපි මෙම වත්කම්වල වටිනාකම් අපගේ පොත්වලින් ඉවත් කරනු ඇත.<br>මෙම අයිතමයන් භාවිතා කළ | භාවිතා කළ නොහැකි වත්කම් චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුව අපහරණය කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | නොහැකි වත්කම් ලෙස හඳුනාගෙන ප්‍රධාන ගබඩා වෙත මාරු කරනු ලබයි. ඒ අනුව, ස්ථාවර වත්කම් ලේඛනයෙන් සහ ස්ථාවර වත්කම් ගිණුම්වලින් එවැනි භාවිතා කළ නොහැකි වත්කම් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබයි. | |
| xii. | මෙම කරුණ පෙර වර්ෂවල සිට නැවත නැවතත් අවධාරණය කර තිබියේදීත්, ව්‍යාපෘති හතක් (07) සම්බන්ධයෙන්, කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වන එකතුව රු. 198,729,791 ක් වූ ශේෂයන්, හේතු හඳුනා ගැනීම සඳහා සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කිරීම සඳහා විමර්ශනය කිරීමෙන් තොරව වසර දොළහක් පුරා නොවෙනස්ව පවතී. | ප්‍රාග්ධනීකරණය සාමාන්‍යයෙන් කොටසින් කොටස ක්‍රියාත්මක වන අතර ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ප්‍රාග්ධනීකරණය කිරීමට වත්කම් පෝරමය එවිය යුතුය. එසේම, විවිධ අවස්ථාවලදී තක්සේරු කිරීම සහ සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ලබා ගත යුතුය. ඉහත කී ව්‍යාපෘති තවමත් එම ක්‍රියාවලියේ පවතී. | එම වත්කම් ප්‍රයෝජනයට ගැනීම සඳහා ව්‍යාපෘතිවල ප්‍රාග්ධනීකරණය නියමිත වේලාවට සිදු කළ යුතුය. |
| xiii. | තාක්ෂණික කමිටුව හරහා සුදුසු ඉඩම් තෝරා නොගැනීම, අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය නොදීම, ඉඩම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම සහ අනවසර පදිංචිය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද කිරීම හේතුවෙන් ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. තවද, ඉඩම් සඳහා දත්ත පද්ධතියක් මණ්ඩලය විසින් ස්ථාපිත කර නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ පනත මගින් මණ්ඩලය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සිදු කරනු ලබන අතර, ඒ සඳහා පියවර මාලාවක් අනුගමනය කරන අතර සම්පූර්ණ කිරීමට වසර කිහිපයක් ගත වේ. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කළ යුතුය. |
| xiv. | තොග සත්‍යාපනයේදී, ප්‍රාදේශිකයන් හතළිහක රු. 66,521,168 ක් වූ අනෙකුත් තොග අයිතම භෞතිකව සත්‍යාපනය කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල තොග ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින්, එම තොගවල පැවැත්ම තහවුරු කළ නොහැක. | රු.66,521,168 ක් වූ අනෙකුත් තොග දැනටමත් වෙන්දේසිය සඳහා යවා ඇති සහ තොග සත්‍යාපන කාල සීමාවේ ගබඩා පරිශ්‍රයේ නොමැති අයිතම නියෝජනය කරයි. එබැවින්, මෙම අයිතම භෞතික තොග සත්‍යාපනය සඳහා භාජනය වී නොතිබුණි. තවද, මෙම අයිතම වසර අවසානය දක්වා අලෙවි කර නොමැති අතර තොග යටතේ ඇතුළත් වේ. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සිය වාර්තාවල එම වත්කම් තිබෙද යන්න සලකා බැලිය යුතු අතර මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයක් පැවැත්විය යුතුය. |

| | | |
|---|---|---|
| xv. 2000 වසරට පෙර මිලදී ගත් රු. 2,000,000 ක පිරිවැයක් සහිත නල කපන යන්ත්‍රයක් අක්‍රිය තොගයක් ලෙස බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථානයේ ගබඩාවේ පැවතුණි. | එය තවමත් නිකුත් කර නොමැති බැවින් එය තොගයේ ඇත. එය නිකුත් කරන විට එය ප්‍රග්ධනීකරණය කරනු ලැබේ. | තාක්‍ෂණය කල් ඉකුත් වීමට පෙර යන්ත්‍රය භාවිත කළ යුතු අතර දීර්ඝ කාලයක් වත්කම් අක්‍රිය කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ගෙන් විමසිය යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට මාර්ගස්ථ තොග (දේශීය මිලදී ගැනීම්) සහ ආනයනික මාර්ගස්ථ තොග පිළිවෙළින් රු. 422,041,459 ක් සහ රු. 5,697,583,838 ක් විය. එම තොග අතරින්, රු. 47,511,660 ක් වූ දේශීය මිලදී ගැනීම් නිරවුල් කිරීමෙන් තොරව මාස තුනකට වැඩි කාලයක් තිස්සේ පැවතුණු අතර රු. 1,982,346,307 ක් වූ ආනයනික මාර්ගස්ථ තොග නිරවුල් කිරීමෙන් තොරව වසර දෙකක කාලයක් තිස්සේ පැවතුණි. | රු. මිලියන 192 අතරින් සඳහන් කර ඇති 2022.12.31 දිනට (වසර 2කට වැඩි) මාර්ගස්ථ තොග ශේෂයන් රු. 114,149,009.15 ක් පමණක් මෙහෙයුම් සහ නඩත්තු අයවැයට අදාළ වේ.<br>- ණයවර ගිණුම් අංක 00034/209/0 ව්‍යාපෘති අරමුදල් යටතේ විවෘත කර ඇත. ව්‍යාපෘතියෙන් ජර්නල් වවුචරය ලැබුණු පසු මෙය පියවිය යුතුය.<br>- අනෙකුත් සියලුම ගිණුම් පියවා ඇත. | මාර්ගස්ථ තොග ශේෂවල දිගුකාලීනව පවතින තොග විමර්ශනය කිරීමට සහ මූල්‍ය ප්‍රකාශනවල මාර්ගස්ථ තොග හඳුනාගැනීමේ නිරවද්‍යතාවය සහතික කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධනය සඳහා ලබා දී ඇති මුළු ප්‍රතිපාදනය වන රු. මිලියන 983.5 න් රු. මිලියන 441.97 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට භාවිතා කර තිබුණි. කෙසේ වෙතත්, සීකේඩී බලපෑමට ලක් වූ ප්‍රදේශවල ජලයෙන් බෝවන රෝග වැළැක්වීම සහ ත්‍රිකුණාමලය ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා පිළිවෙලින් රු, මිලියන 227.0 ක් සහ රු. මිලියන 79.39 ක් ලැබී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට එම මුදලින් පිළිවෙලින් රු. මිලියන 222.9 ක් සහ රු. මිලියන 75.86 ක් පමණක් භාවිතා කර තිබුණි. | කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් වැඩ බිම්වල ශ්‍රම හිඟය, ද්‍රව්‍ය සැපයීමේ ප්‍රමාදය යනාදිය හේතුවෙන් අපේක්ෂිත අරමුදල් භාවිතය සපුරා ගැනීමට නොහැකි විය. | ව්‍යාපෘති සඳහා ලැබෙන අරමුදල් සම්පූර්ණයෙන්ම භාවිතා කරන බවට සහතික වීම. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | රු. 33,148,739 ක වියදමින් ජල සම්පාදන යෝජනා ක්‍රම හතරකට (දමන, ඉරක්කමන්, සාගම්ම සහ මන්දන) අදාළව ඉදිකරන ලද කාර්යාල නිල නිවාස 13 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අක්‍රියව පැවතුණි. | මේවා අතහැර දමා ඇති නමුත් අනාගත භාවිතය සඳහා මේවා පුනරුත්ථාපනය කරනු ඇත. | නිලධාරීන්ගේ නිල නිවාස සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| ii. | ඉගිනියාගල, වඩිනාගල සහ දමන ජල සම්පාදන යෝජනා ක්‍රමවලට අදාළව පිළිවෙලින් රු. 5,585,337 ක් සහ රු. 9,157,499 ක් වටිනා සියලුම ඉදිකිරීම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අක්‍රියව පැවති අතර එම වත්කම් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේවා අතහැර දමා ඇති නමුත් අනාගත භාවිතය සඳහා මේවා පුනරුත්ථාපනය කරනු ඇත. | වත්කම් ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු සම්පාදනය කිරීම. |
| iii. | ගම්පහ, අත්තනගල්ල සහ මීනුවන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා චීන සංවර්ධන බැංකුව විසින් ලබා දී ඇති ණය සඳහා ලද සහන කාලයෙන් පසුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී එ.ජ.ඩො මිලියන 37.5 ක ණය වාරික පහක් ගෙවා ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට චීන සංවර්ධන බැංකුව විසින් ලබා දෙන ලද ණයවලින් රු. මිලියන 18,887.57 ට සමාන එ.ජ.ඩො 50,826,785.94 ක මුදලක් හෝ ණය මුදලින් සියයට 30 ක් ව්‍යාපෘති කටයුතු සඳහා යොදා නොගෙන එස්කො ගිණුමේ රඳවා ගෙන තිබුණි. | චීන සංවර්ධන බැංකුව ණය ගිවිසුම ප්‍රතිව්‍යුහගත කිරීමට එකඟ නොවූ නමුත් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා නොගෙවූ ශේෂය අවශ්‍ය වන බැවින් එස්කො ගිණුමේ තැන්පත් කර ඇත. | අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවේ සහ මූල්‍ය ගිවිසුම්වල එකඟ වූ කාල සීමාවට පෙර ව්‍යාපෘතිය නිම කිරීමට ක්‍රියා කළ යුතුය. |

### 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩවල ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘති දහහතක් සහ දේශීය බැංකු අරමුදල් සපයන ව්‍යාපෘති පහක් සම්බන්ධයෙන්, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය, ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදය, පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ගැටළු, කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේ ප්‍රමාදය යනාදිය හේතුවෙන් අවස්ථා 02 සිට 07 දක්වා වූ පරාසයක කාලය දීර්ඝ කිරීම් ලබා | ප්‍රධාන හේතු කිහිපයක් නිසා ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද විය. 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය, රජයේ ප්‍රතිපාදන හිඟය නිසා 2019 දී මාස 8 ක් සඳහා බිල්පත් සඳහා ගෙවීම් නොකිරීම, 2020 අප්‍රේල් කොවිඩ් ප්‍රශ්න, 2022 ඉන්ධන හිඟය ගොවීන්ගේ | • ව්‍යාපෘති ප්‍රමාදයන් වළක්වා ගැනීමට සහ එමගින් කොන්ත්‍රාත්කරුවන්ට දීර්ඝ කිරීම් ලබා දීම වළක්වා ගැනීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවෙකු |

| | | | |
|---|---|---|---|
| | දීමෙන් පසුව පවා දින 275 සිට දින 2,131 දක්වා වූ පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | විරෝධතාව, අරමුදල් සපයන ආයතනවලින් බිල්පත් නොගෙවීම. | ට කාලය දීර්ඝ කිරීමක් ලබා දී ඇති අවස්ථාවක, කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන අනුව ප්‍රමාද හානි අඩු කිරීම සහතික කිරීම.<br>• ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් ව්‍යාපෘතිය සමීපව අධීක්ෂණය කිරීම. |
| ii. | ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා චීන සංවර්ධන බැංකුවක් විසින් ලබා දී ඇති ණයවලින් එ.ජ.ඩො 50,859,161 ට සමාන රු. මිලියන 18,887 ක මුදලක් හෙවත් සියයට 22.17 ක්, ව්‍යාපෘතිය අවසන් කිරීමේ කාලය ආරම්භයේ සිට අවස්ථා 5 කදී 2023 දෙසැම්බර් දක්වා දීර්ඝ කර තිබියේදී පවා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ව්‍යාපෘති කටයුතු සඳහා යොදා නොගෙන එස්ක්‍රො ගිණුමේ රඳවාගෙන තිබුණි. තවද, කොන්ත්‍රාත් ගිවිසුමට අනුව පළමු අතුරු ගෙවීම් සහතිකයේ සිට මාස 36 ක් ඇතුළත මූලික ගෙවීම සහ අත්තිකාරම් ගෙවීම අතුරු ගෙවීම් සහතිකවලින් අයකර ගත යුතු අතර, මූලික ගෙවීම සහ අත්තිකාරම් ගෙවීම පිළිවෙළින් එ.ජ.ඩො 10,313,661 ක් සහ එ.ජ.ඩො 3,802,889 ක්, මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භයේ සිට මාස 53 ක් ගත විමෙන් පසුව පවා අයකර ගැනීමට නොහැකි වී තිබුණි. එබැවින්, මණ්ඩලය ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති අරමුදල් ඵලදායී ලෙස භාවිතා කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව, බලමුලු ගැන්වීමේ අත්තිකාරම් සහ මූලික ගෙවීම සිදු කරන ලද කාර්යය මත ආපසු අයකරනු ලබන අතර කොන්ත්‍රාත් කාල සීමාව මත පදනම් නොවේ. එබැවින් ඉදිකිරීම් කාලය අවසන් වන තුරු අත්තිකාරම් සහ මූලික ගෙවීම අයකර ගත යුතුය.<br>කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව, අත්තිකාරම් ගෙවීම සහ මූලික ගෙවීම කොන්ත්‍රාත් කාලය අවසන් වන විට ආපසු අයකර ගත යුතුය. මුල් කොන්ත්‍රාත් කාලය මාස 36 කි.<br>පසුව පිළිගත හැකි හේතු සලකා බලා දීර්ඝ කිරීම් ලබා දී ඇත. එබැවින්, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව, ඉහත ගෙවීම් ආපසු අයකර ගැනීම ප්‍රමාද විය. | ව්‍යාපෘති ප්‍රමාදයන් වළක්වා ගැනීමට සහ එමගින්<br>කොන්ත්‍රාත්කරුවන්ට දීර්ඝ කිරීම් ලබා දීම වළක්වා ගැනීමට කටයුතු කළ යුතු අතර<br>කොන්ත්‍රාත්කරුවෙකුට කාලය දීර්ඝ කිරීමක් ලබා දී ඇති අවස්ථාවක, කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන අනුව ප්‍රමාද හානි අඩු කිරීම සහතික කිරීම. |
| iii. | 2021 දෙසැම්බර් 15 වැනි දින අත්තිකාරම් වශයෙන් රු. 1,426,618,536 ක මුදලක් ලබා දී ඇති තත්ත්වයකදී පවා ආර්ජ්එම්පී කමිටුව විසින් අදියර II හි I වන අදියර, රත්මලාන, මොරටුව අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවා තිබුණි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය මඟින් ඉතා මන්දගාමී | බලමුලු ගැන්වීම, රක්ෂණ සහ කාර්ය සාධන බැඳුම්කර වැනි පූර්ව ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් පසු 2022.05.12 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. ඉදිකිරීම් කටයුතුවල මන්දගාමී ප්‍රගතියට ප්‍රධාන | ව්‍යාපෘති ප්‍රමාදයන් වළක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රගතියක් වාර්තා කර ඇති අතර සංරචක නවයෙන් සංරචක 5 ක වැඩ ආරම්භ කර නොතිබුණු අතර වැඩ ආරම්භ කර මාස 15 ක් ගත වුවද සංරචක තුනක ප්‍රගතිය සියයට 6 ක් පමණ වන බව දැකිය හැක. එබැවින් දුර්වල ව්‍යාපෘති අධීක්ෂණය හේතුවෙන් මණ්ඩලයේ මුදල් ව්‍යාපෘතිය සඳහා යොදා නොගෙන දීර්ඝ කාලයක් තිස්සේ කොන්ත්‍රාත්කරුවන් ළඟ පවතී. | වශයෙන් ආර්ථික අර්බුද තත්වයන් (2022 දී) හේතු වේ.<br>තවද, 2023 පෙබරවාරි 10 වන දින පැවති ඒඑෆ්ඩී දූත මෙහෙවරේ මෙහෙවර වාර්තාවට සහ ශ්‍රී ලංකා රජයට (ඊආර්ඩී) අනුව, මෙම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය එහි සඳහන් කර ඇති අතිරේක කාර්යයන් සිදු කිරීම සඳහා 2023 දෙසැම්බර් දක්වා අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.<br>තවද, ශ්‍රී ලංකා රජයේ අතුරු ණය ප්‍රතිපත්තිය හේතුවෙන් ලබාදුන් අත්තිකාරම් ප්‍රමාණය දක්වා විෂය පථය අඩු විය. | |
| iv. | මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත ක්‍රමෝපාය කිරීම සහ වේගවත් කිරීම සම්බන්ධයෙන් 2022 සැප්තැම්බර් 05 දිනැති සහ අංක. 22/1286/604/022 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දී ඇති නියෝග අනුව සහ අංක. පීඑම්ඕ/ඩීඊවී II/2/2/1 දරණ අග්‍රාමාත්‍ය ලේකම් විසින් 2022.10.28 දින නිකුත් කරන ලද ලිපිය අනුව, 2022 දෙසැම්බර් 31 දිනට නිම කළ යුතු ව්‍යාපෘති හතක් 2022 දෙසැම්බර් 31 දිනට නිම කර නොතිබූ අතර තාවකාලිකව අත්හිටුවිය යුතු ව්‍යාපෘති 12 ක් තවමත් අත්හිටුවීමේ ක්‍රියාවලියේ පවතී. තවද, 2023 වසර තුළදී ව්‍යාපෘති 10 ක් සම්පූර්ණ කිරීමටත්, 2023 වර්ෂයේදී ව්‍යාපෘති දෙකක් තාවකාලිකව අත්හිටුවීමටත් කමිටුව නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත්, එම ව්‍යාපෘති සඳහා සැලකිය යුතු මුදලක් වැය කර තිබුණද, එම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි විය. | අවශ්‍ය සියලුම සංශෝධන සහිතව ව්‍යාපෘති නැවත ක්‍රමෝපාය කිරීමට දැනටමත් කටයුතු කර ඇත. | දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| v. | සබරගමුව ප්‍රාදේශීය සභාය මධ්‍යස්ථානයේ රු. 9,995,969 ක් වූ අවසන් කරන ලද ව්‍යාපෘති පහක් කිසිදු සම්පූර්ණ කිරීමකින් තොරව අක්‍රියව පවතී. | පිළිතුරු සපයා නොමැත. | දැනටමත් භාවිතා කර ඇති අරමුදල්වලින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| vi. | මණ්ඩලය විසින් අපහරණය කරන ලද වාහන 196 ක් තවමත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇති අතර ලියාපදිංචි කළ වාහන 32 ක් හඳුනාගත නොහැක. | එය විමර්ශනය කරමින් පවතින අතර වාහන 196 ක් මණ්ඩලය විසින් වරින් වර අපහරණය කර ඇත. | අනවශ්‍ය බැඳීම් මඟහරවා ගැනීමට අපහරණය කරන ලද වාහනවල මණ්ඩලයේ නම ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීම සහ වාහන 32 සම්බන්ධයෙන් හේතු සෙවීම. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | පිඩාවට සහ අවදානමට ලක් වූ පාරිභෝගිකයින් සඳහා ජලය සැපයීමට මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහන යටතේ රු. 228,540,780 කට මිළදී ගත් ජල ටැංකි සඳහා සුදුසු වේදිකා සහිත කැබ් රථ 30 සමාලෝචිත වර්ෂය තුළදී අපේක්ෂිත කාර්යය සඳහා භාවිත කර නොතිබුණි. එබැවින්, කැබ් රථවලට ජල ටැංකි සවි කිරීම සඳහා සුදුසු වානේ වේදිකාවක් සැකසීමට සහ සවි කිරීමට වැය කළ රු. 24,000,000 ක මුදල මණ්ඩලයට අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි. | වැසිය පිටරටින් මිළදී ගෙන ඇති අතර බොඩි එක ලංකාවේදී නිෂ්පාදනය කර ඇත. ආනයනය කරන වාහන සඳහා විශාල බදු අයකිරීම හේතුවෙන් එසේ සිදු කර ඇත. දේශීය අගය එකතු කිරීමක් සිදු කර ඇත. | ව්‍යාපෘතිය සඳහා ලද මුදල් ආර්ථිකමය අරමුණු සඳහා යෙදවිය යුතුය. |
| ii | නිල්වලා ගඟ සඳහා අලුතින් සාදන ලද ලවණතා බාධකය සැලසුම් කිරීමේ අදියරේදී හඳුනාගෙන නොතිබූ ගංවතුර හේතුවෙන් වගා හානි සඳහා ගොවීන් වෙත වන්දි වශයෙන් රු. 7,921,891 ක් ගෙවා තිබුණි. නව ඇළ සංවර්ධනය කිරීමට සහ බාධකය හේතුවෙන් ඇතිවන ගැටලු මඟහරවා ගැනීම සඳහා ජලය පොම්ප කිරීමට අවශ්‍ය ඩීසල් සඳහා ගෙවීමට තවත් රු. 11,075,000 ක් වෙන් කර තිබුණි. | මුහුදු ජලය ගංගා ජලයට මිශ්‍ර වීම වැළැක්වීම සඳහා ලවණතා බාධකයක් ඉදිකර ඇත. උදම් රළ සමඟ මුහුදු ජල මට්ටම ඉහළ යන විට ගඟේ ගලා යන ජලය කුඹුරුවල පැතිරෙනු ඇත. එය පරිසරයේ ස්වභාවික සංසිද්ධියකි. | අනවශ්‍ය වියදම් මඟහරවා ගැනීම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කරන අවස්ථාවේ දී සියලු ගැටලු හඳුනාගත යුතුය. |
| iii | මූල්‍ය හැකියාව නොමැති වීම හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කරන ලද කොන්ත්‍රාත්කරුට එ.ජ.ඩො 765,000 ක් සහ රු. මිලියන 9.9 ක් (එස්යූපී ඇන්ඩ් එම්එම්/සීඑච්ඊඑම්/ඒඑල්යූඑම්-01/2021/02) වටිනා ඇලුමිනියම් සල්ෆේට් ටොන් 3,000 ක් සැපයීම සහ භාර දීම සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. කෙසේ වෙතත්, භාණ්ඩ සැපයීමට අපොහොසත් වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙතින් ඇවර කළ අලාභ | පිළිතුරු සපයා නොමැත. | භාණ්ඩ සැපයීමට අපොහොසත් වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් ඇවර කළ අලාභ ඉල්ලා සිටිය යුතුය. |

ඉල්ලීමෙන් තොරව මණ්ඩලය කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි.

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **3.7.1** | **මාතර අදියර IV - ජල සම්පාදන ව්‍යාපෘතිය** | | |
| i | 2030 වසරේදී අපේක්ෂිත ජනගහනය 321,954 ක් සඳහා පානීය ජලය සැපයීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. එහි කටයුතු 2017 ඔක්තෝබර් 11 වන දින ආරම්භ කර 2020 ඔක්තෝබර් 10 දින නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරීත්ව, සැලැස්ම අනුමත කර ගැනීමේ ප්‍රමාදය සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය යනාදි හේතූන් මත අවස්ථා තුනකදී 2023 මාර්තු 31 දක්වා කාලය දීර්ඝ කර තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 93.1 ක් පමණක් විය. | ඩබ්ලිව්ටීපී හි ඉඩම් හිමියාට නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබීම, සැලැස්ම අනුමත කර ගැනීමේ ප්‍රමාදය, ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය, කොවිඩ් 19 වසංගතයේ බලපෑම, ආර්ථික අර්බුදයේ බලපෑම සහ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම ප්‍රමාද කිරීම යනාදී හේතු නිසා 2022 මාර්තු 31 දක්වා සිව් වතාවක් කාලය දීර්ඝ කිරීම් ලබා දී ඇත. | • කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.<br>• ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර සියලුම ඉඩම් අත්පත් කර ගෙන ඇති බවට සහ සියලුම සැලසුම් අනුමත කර ගෙන ඇති බවට සහතික වීම |
| ii | එෆ්.අයි.ඩී.අයි.සී මාර්ගෝපදේශයේ 14.6 ඡේදයට පටහැනිව, මාතර අදියර IV ජල සම්පාදන ව්‍යාපෘතිවලට අදාළව මණ්ඩලයේ කමිටු තීරණය අනුව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 2.5 ට අඩු බිල්පත් 04 ක් සඳහා මණ්ඩලය විසින් රු. 1,019,104,555 ක් ගෙවා තිබුණි. එබැවින්, සැලසුම් කළ පරිදි ව්‍යාපෘතියේ කටයුතු ආවරණය කිරීමට නොහැකි වූ අතර ව්‍යාපෘතිය දැනටමත් වසර දෙකකින් ප්‍රමාද වී ඇත. | 2021 සහ 2022 කාලපරිච්ඡේදය තුළ රටේ කොවිඩ් තත්ත්වය සහ මූල්‍ය අර්බුදය සලකා බලා අවම ගෙවීම් අවශ්‍යතාවය (කොන්ත්‍රාත් මුදලින් සියයට 2.5) සලකා නොබැලීමට ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයා චක්‍රලේඛයක් මඟින් අනුමැතිය ලබා දී ඇත. | එෆ්.අයි.ඩී.අයි.සී මාර්ගෝපදේශවලට අනුකූල වීම. |

### 3.7.2 සැමට ජලය ව්‍යාපෘතිය

2025 වසර අවසානයේ රටේ සියලුම ජනතාවට ජලය ලබා දීමේ අරමුණින් 2021 වර්ෂයේදී ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. වාර්ෂික අයවැය යටතේ රු. මිලියන 24,568 ක්, රු. මිලියන 29,568 ක් සහ රු. මිලියන 17,000 ක් බැගින් පිළිවෙලින් 2020,2021 සහ 2022 වර්ෂය සඳහා

| | | | |
|---|---|---|---|
| | අරමුදල වෙන් කර ඇත. | | |
| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.5.1(අ) වගන්තියේ අවශ්‍යතා අනුව සැමට ජලය නැමති ව්‍යාපෘතිය ආරම්භයේදී ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් විසින් අරමුදල් ලබා ගත හැකි බව තහවුරු කර නොතිබුණි. එබැවින්, 2020 වර්ෂයේදී අරමුදල් ලැබී නොමැති අතර 2021 වර්ෂයේදී සහ 2022 වර්ෂයේදී පිළිවෙලින් රු. මිලියන 7,559 ක් සහ රු. මිලියන 5,400 ක් පමණක් ලැබී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2022 දෙසැම්බර් 31 දිනට සැලසුම් කර ඇති ව්‍යාපෘති ක්‍රියාකාරකම් 2,914 න් ක්‍රියාකාරකම් 1,330 කින් සියයට 6 ක හෝ සියයට 6 ට අඩු ප්‍රගතියක් පමණක් ලබා ගෙන තිබුණි. තවද, 2022 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිය සඳහා ආනයනය කරන ලද රු. 3,540,605,851 ක් වටිනා එච්ඩීපීඊ බට නිසි කළමනාකරණයක් නොමැති වීම හේතුවෙන් දිවයින පුරා අනාරක්ෂිත ලෙස ගබඩාවල පවතී. | සැමට ජලය වැඩසටහනේ විෂය පථය, ධාරිතාව වැඩි කිරීමේ සහ බෙදා හැරීම පුළුල් කිරීමේ වැඩසටහන සමඟ ආදේශනය කර ඇත. එබැවින්, ආරම්භක විෂය පථය සංකෝචනය වී ඇත. | ප්‍රසම්පාදන කමිටුව ව්‍යාපෘතිවල ශක්‍යතාවය සහතික කළ යුතුය. |
| **3.7.3** | හම්බන්තොට අරබොක්ක ඖෂධ කලාපයේ ජල සම්පාදන ව්‍යාපෘතියට අදාළව කොන්ත්‍රාත් අංක. RSC(S)/P&C/S/DI/VALVES/PHARPMAZONE/H'TOTA/RECHARGEBLE/2021/185 යටතේ වන කොන්ත්‍රාත්තුව නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූ කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.11 වගන්තිය හෝ කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අනුව ප්‍රමාද ගාස්තු හෝ ඇවර කළ අලාභ ඉල්ලා සිටීමෙන් තොරව මණ්ඩලය කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කර තිබුණි. | වසංගත හා ආර්ථික අර්බුදය හේතුවෙන් සම්පූර්ණ කිරීමට නොහැකි විය. | ගිවිසුමේ කොන්දේසිවලට අනුකූල වීම. |
| **3.7.4** | 2015 සහ 2016 වර්ෂයන් තුළදී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අවශ්‍ය මුදල් ලබා දී තිබුණද, රත්නපුර රෝහලේ ජල පවිත්‍රාගාරය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව වසර 3 ක ප්‍රමාදයකින් යුතුව 2018 ඔක්තෝම්බර් 17 වැනි දින ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව, කොන්ත්‍රාත්තුව 2019 පෙබරවාරි 28 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්**,** කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් 2022 නොවැම්බර් මාසය අවසන් වන විටත් කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි. තවද, අත්තිකාරම් බැඳුම්කරයේ වලංගු කාලය අවසන් වන තෙක් කොන්ත්‍රාත්කරු වැඩ ආරම්භ කිරීමට අපොහොසත් වී තිබුණි. | දුර්වල කාර්ය සාධනය හේතුවෙන් කොන්ත්‍රාත්කරුගේ වැඩ තහනම් කර ඇත. කෙසේ වෙතත්, පසුව කාලය දීර්ඝ කිරීමත් සමඟ ගිවිසුමේ විෂය පථය වෙනස් කර ඇත. | නියමිත කාල සීමාව තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමට සමීපව නිරීක්ෂණය කිරීම. |

**3.8 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි ඡේද අංක 3.5 සහ 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 3.5 හි විධිවිධානවලට පටහැනිව, සමාලෝචිත වර්ෂය තුළදී, රේඛීය අමාත්‍යාංශය වෙත නිදහස් කර ඇති සේවකයින් පහළොස් දෙනෙකුගේ වැටුප් හා දීමනා ලෙස මණ්ඩලය විසින් රු. මිලියන 22.87 ක මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව, 2015 දෙසැම්බර් සිට 2022 දෙසැම්බර් 31 දක්වා නිදහස් කර ඇති සේවකයින් වෙනුවෙන් ජල සම්පාදන අමාත්‍යාංශය විසින් මණ්ඩලයට රු. මිලියන 238.99 ක මුදලක් ප්‍රතිපූරණය කළ යුතුය. | ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තියට අනුව, සැමට පිරිසිදු ජලය වෙත ප්‍රවේශ වීමේ අවකාශය ඉහළ නැංවීම සඳහා සැමට ජලය නැමති වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. එබැවින්, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය විශාල වශයෙන් සම්බන්ධ වී සිටින අතර කාර්ය මණ්ඩල වැටුප් මණ්ඩලයට ප්‍රතිපූරණය කිරීමේ පදනම මත මෙම වැඩසටහනට සහය දැක්වීම සඳහා කාර්ය මණ්ඩලය නිදහස් කර ඇත. නමුත් මේ සඳහා අයවැය ප්‍රතිපාදන නොමැතිකම නිසා එවැනි ප්‍රතිපූරණයක් ලබාදීම දුෂ්කර බව අමාත්‍යාංශය දන්වා ඇත. | මෙහෙයුම් අත්පොතෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වීම. |

**3.9 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2022 සැප්තැම්බර් 30 වැනි දිනට ඉහළ මට්ටමේ පුරප්පාඩු 22 ක්, මධ්‍යම මට්ටමේ පුරප්පාඩු 45 ක් සහ පහළ මට්ටමේ පුරප්පාඩු 1957 ක් ඇතුළුව පුරප්පාඩු 2024 ක් පිරවීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | සමහර බඳවා ගැනීම් සිදු කර තිබූ අතර බාහිරව බඳවා ගත යුතු v,vi,vii සහ viii,ix,x,xi,xii,xiv යන මාණ්ඩලික ශ්‍රේණි සඳහා වන සමහර බඳවා ගැනීම් 2022 අප්‍රේල් 26 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක. 03/2022 අනුව අත්හිටුවා තිබුණි. | මණ්ඩලයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම හෝ සේවක සංඛ්‍යාව පිළිබඳ නිසි ඇගයීමකින් පසු මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම. |
| ii. | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.2(i) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ යෝජනා ක්‍රමය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කෙටුම්පත් බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| iii. | එක් ව්‍යාපාර කළමනාකරුවකු, උපකරණ අලුත්වැඩියා කරන්නන් 05 දෙනෙකු, කම්මල්කරුවන් 02 දෙනෙකු, සනීපාරක්ෂක සහායකයින් 17 දෙනෙකු බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාවට අමතරව ඉහත සඳහන් තනතුරුද අතුළත්ව දත්ත විශ්ලේෂක, සැපයුම් නිලධාරි, කළමනාකරණ සහකාර, මනු කියවන්නන් සහ කැණීම් ක්‍රියාකරුවන් සඳහා සේවකයින් 75 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | ව්‍යාපාර කළමනාකරු තනතුර සඳහා අනුමැතිය නොමැති වුවද සීර්ඩබ්ලිව්ඒඑස් මධ්‍යස්ථානයේ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇත. 2012 වසරේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව අනුමත කිරීමේදී අනෙකුත් තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබූ අතර ඔවුන් විශ්‍රාම ගැනීමෙන් පසු මෙම තනතුරු අහෝසි කරනු ඇත. | මණ්ඩලයට අනවශ්‍ය පිරිවැයක් දැරීම වැළැක්වීම සඳහා නව තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත යුතුය. |
| iv. | සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු 52 ක් සහ සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) තනතුරු 16 ක් සඳහා අනුමැතිය ලබාගෙන තිබුණද, සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු 61 ක් පමණක් පත් කර තිබුණු අතර සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) තනතුරු සඳහා කිසිවකු පත් කර නොතිබුණි. | ඒකාබද්ධ තනතුරු සලකා බලමින් මෙම තනතුරු දෙක සඳහා පත් කිරීම් සිදු කර ඇත. | මණ්ඩලයේ සේවා අවශ්‍යතා තක්සේරු කර අනුමැතිය ලබා දෙන බැවින් අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව සඳහා පමණක් පත් කිරීම් සිදු කළ යුතුය. |
| v. | සැමට ජලය නැමති ව්‍යාපෘතියේ සිවිල් ඉංජිනේරු, ප්‍රමාණ මිනින්දෝරු, ඉංජිනේරු සහකාර (සිවිල්) යන තනතුරු සඳහා බඳවා ගත් සේවකයන් 157 දෙනා සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කීපවතාවක්ම අනුමැතිය ඉල්ලා ඇතත් මේ දක්වා අනුමැතිය ලැබී නොමැත. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර අනුමැතිය ලබා ගත යුතුය. |
| vi. | ප්‍රධාන කාර්යාලයේ සේවක ස්ථාන මාරුවීම් පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබූ අතර සේවා නියුක්තිය පිළිබඳ දත්ත සමුදාය මානව සම්පත් අංශය විසින් නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. එබැවින්, ස්ථාන මාරු ප්‍රතිපත්තියේ කාර්යක්ෂමතාව සහ සඵලතාවය තහවුරු කිරීමට සාක්ෂි නොතිබුණි. | මෙම ස්ථාන මාරුව සේවකයාගේ කැමැත්ත ඇතිව ක්‍රියාත්මක වන අතර වසර පහක් සම්පූර්ණ වූ විට සේවකයින්ට අපහසුතාවයක් ඇති වන පරිදි ස්ථාන මාරු කිරීම සිදු නොකෙරේ. නව දත්ත සමුදාය හඳුන්වාදීම සිදු වෙමින් පවතින අතර මේ මොහොතේ සේවකයා පිළිබඳ සියලු තොරතුරු සැපයීමට දත්ත සමුදායක් නොමැත. | සේවකයින්ගේ ප්‍රතිලාභ සඳහා සේවකයින් මාරු කිරීම සඳහා දත්ත සමුදාය වහාම සංවර්ධනය කිරීම. |

| | | | |
|---|---|---|---|
| vii. | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය අනුව බීඑස්සී/ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) උපාධියක් හෝ පිළිගත් සංවිධානයකින් වරලත් සහතිකයක් සමඟ මණ්ඩලයේ ලේකම් තනතුරේ වසර 8 ක පළපුරුද්ද ඇතුළුව ලේකම් තනතුරේ වසර 15 ක පළපුරුද්දක් ලේකම් (විශේෂ ශ්‍රේණියේ) තනතුර සඳහා අවශ්‍ය වුවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව එම තනතුර සඳහා උසස්වීම් ලබාදීමේදී පන්තියක් සමඟ විශේෂ උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලෙස අවශ්‍යතාවය සංශෝධනය කර ඇත. කෙසේ වෙතත්, එම සංශෝධනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සංශෝධනය කර ඇති අතර ඒ අනුව පුරප්පාඩු සඳහා අභ්‍යන්තර අයදුම්පත් කැඳවා තිබුණි. | සංශෝධන සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |
| viii. | නියැදි විගණනයට අනුව, සේවකයින් බඳවා ගැනීමේදී සහ උසස්වීම් ලබාදීමේදී පත්වීම් ලිපියට අනුව අධ්‍යාපනික, වෘත්තීය සහ සේවා සහතිකයේ නිරවද්‍යතාවය තහවුරු කර නොමැති බව අනාවරණය විය. | කළමනාකරණ සහකාර ආශ්‍රිත තනතුරු සඳහා අ.පො.ස සා.පෙළ සහ උසස් පෙළ සඳහා වන සහතික මේ දක්වා තහවුරු කර ඇති අතර ඉදිරියේදී සියලුම බඳවාගැනීම් තහවුරු කිරීමට බලාපොරොත්තු වේ. | සේවය ස්ථිර කිරීමට පෙර සියලුම බඳවා ගැනීම් සඳහා වන සහතික තහවුරු කළ යුතුය. |
| ix. | විමර්ශන කොට්ඨාශයේ සේවකයින් 25 දෙනෙකු පමණක් සිටීම හේතුවෙන් 2020 ජනවාරි සිට 2022 නොවැම්බර් දක්වා ලැබුණු පැමිණිලි 182 න් පැමිණිලි 68 ක් පමණක් විභාග කර තිබුණි. | කොන්ත්‍රාත් සේවකයින් බඳවාගෙන ඇති අතර මෙම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා පැවරුම් පදනම මත සහය ලබා ගැනීමට අපේක්ෂා කරයි. | සේවකයින් අතර විශ්වාසය වර්ධනය කිරීම සඳහා විසඳුම් ක්‍රියා පටිපාටිය කඩිනම් කිරීම අවශ්‍ය වේ. |